# මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
## அளவீட்டு அலகு, நியமங்கள் மற்றும் சேவைகள் திணைக்களம்
## MEASUREMENT UNITS, STANDARDS AND SERVICES DEPARTMENT

**නිවැරදි මිනුම් අපගේ වගකීමයි**

**சரியான அளவீடு எமது பொறுப்பாகும்**

**Correct Measurement is Our Responsibility**

# කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්
## செயலாற்று அறிக்கைகளும் ஆண்டு கணக்குகளும்
## PERFORMANCE REPORT AND ANNUAL ACCOUNTS

# 2018

# කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් 2018

## මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව

පටුන


**අධ්‍යක්ෂක පණිවිඩය ....................................................................................5**

**දැක්ම..........................................................................................................7**

**මෙහෙවර.....................................................................................................7**

**අරමුණු ..........................................................................................................7**

**01.** හැඳින්වීම

1.1දෙපාර්තමේන්තුව සහ එහි කාර්යය........................................ ..................8

**1.2** මිනුම් විද්‍යාව ......................................................................................10

**02. MUSSD ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව සඳහා වන ඉහළම ආයතනය ලෙස**

**2.1 විද්‍යාත්මක මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්..........................................................11**

**2.1.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML)..........................................11**

**2.1.2 මිනුම් අන්වේෂනතාව ස්ථාපනය කිරීම ........................................12**

**2.1.3 අන්තර් රසායනාගාර සංසන්දනය සඳහා සහභාගී වීම ..........................13**

**2.1.4 ජාත්‍යන්තර ක්‍රමයේ ඒකක (SI) පවත්වා ගැනීම ................................13**

**2.1.5 ශ්‍රී ලංකාවේ සම්මත කාලය උත්පාදනය හා විකාශනය කිරීම...................16**

**2.1.6 පර්යේෂණ හා සංවර්ධනය ...........................................................16**

**2.2 කාර්මික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම් ......................................................17**

**2.2.1 කාර්මික ක්‍රමාංකනය ..................................................................17**

**2.2.2 පුහුණුව සහ උපදේශනය ...............................................................22**

**2.3 නෛතික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම් ......................................................22**

**2.3.1 ක්රියාකාරී ප්‍රමිති නැවත සතෙක්ෂණය කිරීම ....................................23**

**2.3.2 මාදිලි අනුමැතිය ..........................................................................23**

**2.3.3 දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයවන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායනය කිරීම්, පරීක්ෂණ හා වැටලීම් ..........................................24**

**2.3.4 පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා කිරීම ..............................................34**

**2.3.5 නෛයිතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ලියාපදිංචිය..........................35**

**03. MUSSD ජාත්‍යන්තර නියෝජිතයෙකු ලෙස**

**3.1 සාමාජිකත්වය ........................................................................................37**

**3.2 ව්‍යාපෘතිවල ප්‍රතිලාභ.....................................................................................39**

**3.3 විදේශීය ජාතික මිනුම් ආයතන සමඟ සහයෝගීතාවය NMIs........................................41**

**04. MUSSD තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ආධාරකරුවෙකු ලෙස**

**4.1 තිරසාර සංවර්ධන ඉලක්ක සහ මිනුම් විද්‍යාව.................................................42**

**05.** **මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවේහි ශක්තිය (මානව සම්පත් කළමනාකරණය)**

**5.1** කාර්ය මණ්ඩල සංයුතිය ……………………………………………………......45

**5.2 දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ……………………………………........48**

**5.3 විශේෂ වැඩසටහන්**

**5.3.1 මිනුම් විද්‍යා දිනය 2018 ……………………………………………………….54**

**5.3.2 දින දෙකක වැඩ සාප්පුව ………………………………………………………...54**

**5.3.3 මිනුම් සේවා පිළිබඳ ජාතික සමීක්ෂණය ………………………………...........54**

**6. ඉදිරියේ දී ආරම්භ වීමට නියමිත ව්‍යාපෘතීන් ……………………………………........56**

**උපග්‍රන්ථ 1 බර කිරිමේ හා මැනීමේ උපකරණවල අනුමත රටා ……………………………….58**

**උපග්‍රන්ථ 2 වාර්ෂික ගිණුම්**

**A2.1 ඒකාබද්ධ අරමුදල ……………………………………………………………….67**

**A2.2 ආදායම ……………………………………………………………………………….68**

**A2.3 මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අරමුදල ………………………………...............69**

## අධ්‍යක්ෂතුමාගේ නිවේදනය

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ 2018 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවට ඔබ සාදරයෙන් පිළිගනිමු. 2018 වර්ෂය දෙපාර්තමේන්තුවේ බොහෝ අරමුණු වල සංක්‍රාන්තික හා ප්‍රගතියක් ඇතිකළ කාල පරිච්ඡේදයක් විය. අපි අඛණ්ඩව නවාකරණයන් සිදු කළ අතර, මිනුම් විද්‍යාව හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ශක්තිමත් කළෙමු. අපි අපගේ ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් විධිමත් කළ අතර එම කැපවීම ශක්තිමත් භෞතික හා මූල්‍ය ප්‍රගතියකට දායක විය. අපගේ දැක්ම වන්නේ මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වාසනීය මිනුම් ලබා දීමයි. අප මේ වන විට දළ වශයෙන් රුපියල් මිලියන 400ක වාර්ෂික ඉපැයීම් සහිත ආයතනයක් වන අතර 250 කට ආසන්න සංඛ්‍යාවක්ගෙන් සමන්විත විනයගරුක කාර්ය මණ්ඩලයකින්ද සමන්විතය.

වෙනත් ඕනෑම රටක මෙන්, ශ්‍රී ලංකාවේ මිනුම් ක්‍රමයටද විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන මට්ටම් තුනක් ඇත. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) යනු ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යා ආයතනය වන අතර මෙම මට්ටම් තුනම මෙම එකම ආයතනට ගොනුකර ඇත. MUSSD මධ්‍යම මිනුම් විද්‍යා අධිකාරියක කාර්යභාරය ඉටු කරන අතර එයට විද්‍යාත්මක මිනුම් විද්‍යාව හා නෛතික මිනුම් විද්‍යාව මෙන්ම කාර්මික මිනුම් විද්‍යාව සම්බන්ධීකරණය කිරීමේ බලය ද ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ව්‍යාප්ත කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් විද්‍යාගාරය විසිනි.

1974 දී ශ්‍රී ලංකාව සිය මිනුම් ක්‍රමය බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ඒකක පද්ධතියෙන් ජාත්‍යන්තර ඒකක පද්ධතියට පරිවර්තනය වූ (මෙට්‍රික් ක්‍රමය) අවස්ථාවේ අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුවේ මිනුම් ප්‍රමිති සහ සේවා අංශයට මෙට්‍රික් පරිවර්තන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරිණි. මේ සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස මෙට්‍රික් පරිවර්තන අධිකාරියක් පිහිටුවා 1976 අංක 17 දරණ ජාතික මෙට්‍රික් පරිවර්තන නීතිය සකස් කරන ලදී. 1970 සිට 1980 දක්වා කාලය තුළ මෙට්‍රික් ක්‍රමයට මාරුවීමේදී විද්‍යාගාරය වෙත මෙට්‍රික් මිනුම් ප්‍රමිතීන් ලබා ගන්නා ලදී. පසුව 1995 අංක 35 දරණ මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත ශ්‍රී ලංකා රජය විසින් බලාත්මක කරන ලදී. මෙය වෙළඳ හා වාණිජ, කර්මාන්ත, විද්‍යාව සහ නවෝත්පාදන, සෞඛ්‍ය, මහජන ආරක්ෂාව සහ පාරිසරික ආරක්ෂාව යන අංශවල භාවිතා වන සියලු මිනුම්වලට අවශ්‍ය නිරවද්‍යතාව ප්‍රශස්ථ මට්ටමෙන් ළඟා කර ගනිමින් රටෙහි වර්තමාන නීතිය ලෙස ක්‍රියාත්මක වේ. මෙම පනත මගින් මිනුම් විද්‍යාවේ විශාල පරාසයක් ආවරණය කරන අතර එමගින් මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සහ ජාතික මිනුම් විද්‍යාගාරය ද ස්ථාපිත කර ඇත .

1995 අංක 35 දරණ පනත ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මිනුම් පර්යේෂණාගාරය, නෛතික මිනුම් විද්‍යා අංශය සහ පරිපාලන ගොඩනැගිල්ල ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට 2009 වර්ෂයේදී මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ වැදගත්ම විද්‍යාත්මක තීරණය එය වන අතර 2016 වන විට එය යථාර්ථයක් බවට පත්කර ගැනීමට අපට හැකි විය. වර්තමානයේදී, ශ්‍රී ලංකාවේ ඉහළම මිනුම් විද්‍යා අධිකාරිය ලෙස, මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ ස්ථාපිත කිරීම සිදුකරන අතර ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ප්‍රමිතිය නංවාලීම සඳහා වන මිනුම් මත පදනම් වූ නියාමන හා සේවා ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදකයින්, වෙළෙඳුන්, මිනුම් හා වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයින් සඳහා යුක්තිය සහ සාධාරණත්වය සහතික කරයි.

එසේම, ජාත්‍යන්තර ඒකක ක්‍රමය (SI) කාලයක් තිස්සේ ලොව පුරා භාවිතයෙන් පසුව සිදුවූ ප්‍රධානතම සංශෝධනය කිරීම 2018 නොවැම්බර් 16 වන දින, පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය (CGPM) එකඟත්වයට පැමිණියේය.

මේ වෙනස තහවුරු කරමින් පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයෙහි ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව දැනටමත් නව මිනුම් ක්‍රම හා සබැඳි පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙත යොමුව ඇත.

මෙම වසර තුල ලබාගත් ජයග්‍රහණ පිළිබඳ ආඩම්බර වන අතර ඒවා මෙම වාර්ෂික වාර්තාව මගින් පිළිබිඹු වන ඇත .

එස්.එන්.අකුරන්තිලක
මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂ

**දැක්ම**




මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වාසනීය මිනුම්

**මෙහෙවර**




මිනුම් මත පදනම් වූ සේවා හා නියාමන ක්‍රියාකාරකම්වල යෙදෙමින් නිෂ්පාදකයන්, වෙළෙන්දන්, මිනුම් විද්‍යා හෝ වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයන්ගේ සමානත්වය හා යුක්තිය තහවුරු කරන ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුකූල වූ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා ඒවා ප්‍රචලිත කිරීම මගින් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ගුණාත්මකභාවය ඉහල නැංවීම

**අරමුණු**



ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව පිළිබඳ ප්‍රමුඛතම ආයතනය ලෙස ක්‍රියාකිරීම හා 1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත ක්‍රියාත්මක කිරීම තුලින් රටෙහි විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව හා නෛතික මිනුම් විද්‍යාවට සම්බන්ද යටිතල පහසුකම් දියුණු කිරීමට අවශ්‍ය මූලික දායකත්වය ලබාදීම.

## මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව
## කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම් වාර්තාව - 2018

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූලික ප්‍රතිපත්තිය, ක්‍රියාත්මක ව්‍යාපෘතීන්, ක්‍රියාත්මක වැඩසටහන් සහ 2018 වසර තුළ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව දැනුම් දීම මෙම වාර්තාවේ අරමුණයි.

# 1.
## හැඳින්වීම
### 1.1 දෙපාර්තමේන්තුව හා එහි කාර්යභාරය

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) 1995 අංක 35 දරණ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ ස්ථාපිත කරන ලදී. දෙපාර්තමේන්තුව අයත් වන්නේ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයටයි.

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මස 8 වැනි දින සිට කොළඹ 05 (පර්චස් 135 ක භූමි ප්‍රමාණයකින්) පිහිටි පැරණි පරිශ්‍රයේ සිට ඉඩම් අවකාශ ප්‍රමාණවත් නොවීම සහ ජාතික අවශ්‍යතා හා මිනුම් විද්‍යා ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධනය උදෙසා පිටිපන,මාහේන්වත්ත, හෝමාගම ලිපිනයේ පිහිටි තාක්ෂණ නගරයෙහි විද්‍යා මධ්‍යස්ථානය වෙත මාරු වී ඇත.




රූපය 1 : තාක්ෂණ නගරයේ (Tech City) පිහිටීම (Source: Innovation hub of Asia- Tech City Sri Lanka Western Region Tech City Development Project)

මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් නිරවද්‍ය මිනුම් ක්‍රම හා මිනුම් විද්‍යා සේවාවන් සැපයීම, අදාළ නීති හා රෙගුලාසි පැනවීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම, ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වාගෙන යාම, අන්තර්ජාතිකව ඒවා යාවත්කාලීන කිරීම ආදිය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකීම දරයි.

සෑම රටකම ජාතික මිනුම් පද්ධතියක් අර්ථ දක්වා ඒවා ජාතික මිනුම් ප්‍රමිතීන් වශයෙන් එරට තුළ ස්ථාපනය කිරීමේ වගකීම දරන ආයතනයක් ඇත. එය පොදුවේ එක් එක් රටේ ජාතික මිනුම් ආයතනය (National Metrology Institute) ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ එම වගකීම දරන්නේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවයි. දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් පර්යේෂණාගාරය (National Measurement Laboratory) මගින් ශ්‍රී ලංකාව තුළ භාවිත මිනුම් හා සම්බන්ධ ජාතික ප්‍රමිතීන් හඳුනාගෙන ඒවා අර්ථ දක්වා, පවත්වාගෙන යාම සිදු වේ. මීට අමතරව කර්මාන්ත, ඉංජිනේරු, පාරිසරික, සෞඛ්‍ය රැකවරණය, මහමඟ ආරක්ෂාව ආදී ක්ෂේත්‍ර වලදී භාවිතා කරන මිනුම් උපකරණ අංක ශෝධනය කිරීම හා සත්‍යායනය කිරීම ද පර්යේෂණාගාරය මගින් සිදු කරනු ලැබේ.

නෛතික මිනුම් විද්‍යා කාර්යයන් සඳහා නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (OIML) නිර්දේශ භාවිතා කරන අතර එම නිර්දේශවලට අනුකූලව කිරුම් මිනුම් උපකරණවල මාදිලි අනුමත කිරීම, මූලික හා වාර්ෂික සත්‍යායන කිරීම සිදුකරනු ලැබේ.






## 1.2 මිනුම් විද්‍යාව

මිනුම් පිළිබඳව හැදෑරීමේ විෂය සහ යෙදීම් මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. ස්කන්ධය, දිග, කාලය, පරිමාව, විදුලි ධාරාව, විද්‍යුත් ප්‍රතිරෝධ ආදී නොයෙක් රාශීන්ට අදාල මිනුම් එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවලදී අපට අවශ්‍ය වේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් භෞතික රාශි සහ මිනුම් ඒකකවල ඒකමිතියක් පවත්වාගෙන යාම සඳහා කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ සහ නියාමන ක්‍රියාකාරකම් මිනුම් විද්‍යාව ලෙස අර්ථ දැක්විය හැකිය.

මිනුම් විද්‍යාව ප්‍රධාන වශයෙන් උප ක්ෂේත්‍ර තුනකට බෙදිය හැකිය.

01. විද්‍යාත්මක මිනුම් විද්‍යාව - ඉහළම මට්ටමේ මිනුම් ප්‍රමිතීන්ගේ ප්‍රවර්ධනය සඳහා

02. කාර්මික මිනුම් විද්‍යාව - කර්මාන්ත නිෂ්පාදන හා පරීක්ෂා කිරීම් සඳහා භාවිතා වන මිනුම් උපකරණ වල ප්‍රමාණවත් ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යාම සඳහා

03. නෛතික මිනුම් විද්‍යාව -වෙළඳාමෙහි විනිවිදභාවය නෛතිකව බල ගැන්වීම සෞඛ්‍ය ආරක්ෂාව හා පරිසරය යනාදී ක්ෂේත්‍ර මත බලපෑමක් ඇතිකරනු ලබන මිනුම් වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා




රූපය 1.3: මිනුම් විද්‍යාවේ කාණ්ඩ

පනතේ II කොටසේ (3) වගන්තියට අනුව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව තුළ ඇති පර්යේෂණාගාරය ජාතික මිනුම් පර්යේෂණාගාරය ලෙස හැඳින්වේ. III වන කොටස අනුව ජාතික මිනුම් ප්‍රමිති ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ බෙදා හැරීම, IV වන කොටස අනුව වෙළඳාමේ මිනුම් භාවිතය සහ V සහ VI කොටස් අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකිව යුතුය. මේ අනුව දෙපාර්තමේන්තුව විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන අංශ තුනකින් සමන්විත ජාතික මිනුම් පද්ධතිය සඳහා (National Measurement System ) වගකිව යුතුය.

# 2.

## ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව සඳහා වන ඉහළම ආයතනය ලෙස MUSSD

### 2.1 විද්‍යාත්මක මිනුම් විද්‍යාව

මිනුම් විද්‍යාවේ වැදගත්ම ක්ෂේත්‍රය මෙය වේ. විද්‍යාත්මක මිනුම් විද්‍යාව යනු මිනුම් ඒකක පද්ධති හා රාශි පද්ධති පිහිටුවීම, නව මිනුම් ක්‍රම සොයාගැනීම, ජාත්‍යන්තර හා ජාතික මිනුම් ප්‍රමිතීන් හඳුනා ගැනීම, අර්ථ දැක්වීම, පිහිටුවීම හා එම ප්‍රමිතීන්වල ඒකමිතිය පවත්වා ගනිමින් ඒවා භාවිතා කරන්නන් වෙත ව්‍යාප්ත කිරීම පිළිබඳ විෂය ක්ෂේත්‍රයයි. එමෙන්ම මිනුම් දෝෂ හඳුනා ගැනීම හා නිරවුල් කිරීම ආදිය සඳහා බලපාන සෛධාන්තික හා ප්‍රායෝගික කරුණු ද විද්‍යාත්මක මිනුම් විද්‍යා ක්ෂේත්‍රය මගින් ආවරණය වේ.

විද්‍යාත්මක මිනුම් විද්‍යාවට ආදාල ඉහත කාර්යයන් ඉටුකිරීම සඳහා ගෙන ඇති පියවර කිහිපයකි.

01. ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවීම මගින් ජාතික මිනුම් එකක හා මිනුම් ප්‍රමිති පද්ධතිය ස්ථාපනය කිරීම,
02. ජාතික මිනුම් ප්‍රමිතීන් නිරූපනය, ස්ථාපනය, යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම ,
03. ජාත්‍යාන්තර මිනුම් ප්‍රමිතීන්හි උපයෝගීතාවට අනුකූල වන පරිදි ජාතික මිනුම් පද්ධතිය ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම,
04. විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන මිනුම් පරාමිතීන් හා තාක්ෂණය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධන කටයුතු,
05. මිනුම් රාශීන්ට අදාල දේශීය හා ජාත්‍යාන්තර මට්ටමේ ද්විපාර්ශවික හා බහුපාර්ශවික සංසන්දන වැඩසටහන් පවත්වමින් අංක ශෝධනය හා මිනුම් ශක්‍යතා ඉහළ නැංවීම,
06. මිනුම් විද්‍යා පර්යේෂණ කටයුතු,
07. ශ්‍රී ලංකාවේ සම්මත වේලාව නිපදවීම හා www.sltime.org_වෙබ් අඩවිය ඔස්සේ විකාශනය කිරීම,

#### 2.1.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය

ජාතික මිනුම් ඒකක ක්‍රමය ස්ථාපනය, අංකශෝධන හා පරීක්ෂණ විද්‍යාගාර, නියාමන ආයතන, කර්මාන්ත හා නෛතික මිනුම් විද්‍යා ක්ෂේත්‍ර සඳහා අන්වේෂණය (Traceability)පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හෝමාගම, පිට්පන, මාහෙන්වත්තෙහි පිහිටි එහි නව පරිශ්‍රයෙහි විද්‍යාගාර කාමර 64 සහිතව ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා ඇත. වර්තමානයේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපර්තුමෙන්තුව මිනුම් ක්ෂේත්‍ර 10ක් සඳහා විද්‍යාගාර පවත්වාගෙන යයි.

වගුව 1 : ජාතික මිනුම් පර්යේෂණාගාරය

| විද්‍යාගාරය | විද්‍යාගාර ප්‍රධානී | දුරකතන අංක |
|---|---|---|
| ස්කන්ධය | ආර්.ඩී.එම්.අලංක මහතා<br>කලනි මල්ලවආරච්චි මිය | 0112-182262<br>0112-182263 |
| මානමිතිය | ඒ.ඩී.ඩී.නමින්ද මහතා | 0112-182267 |
| කාලය හා සංඛ්‍යාතය | ආර්.පී.එස්.ඒ.පෙරේරා මහතා | 0112-182265 |
| උෂ්ණත්වය | එස්.එන්.අකුරන්තිලක මහතා | 0112-182256 |
| සරළධාරා සහ ප්‍රත්‍යාවර්ථධාරා විද්‍යුතය | ආර්.පී.එස්.ඒ.පෙරේරා මහතා<br>ජී.ඩබ්.සී.විජයසුන්දර | 0112-182265<br>0112-182257 |
| පීඩනය | ජේ.එස්.එම්.සිල්වා මිය | 0112-182264 |
| පරිමාව | එච්.එල්.අයි.එස්.සම්පත් මහතා | 0112-182266 |
| විද්‍යුත් ජවය හා ශක්තිය | ආර්.ඩී.එම්.අලංක මහතා | 0112-182262 |
| රසායනික මිනුම් | එස්.ඩී.අයි.ඩයස් මහතා | 0112-182258 |
| වායුන් පිළිබඳ මිනුම් | ආර්.පී.එස්.ඒ.පෙරේරා මහතා | 0112-182265 |

වගුව 2 : ජාතික මිනුම් පර්යේෂණාගාරය - ප්‍රමිතීන්

| පාරාමිතික මිනුම් | මූලික ප්‍රමිති |
|---|---|
| ස්කන්ධය | 1 kg national prototype of kilogram<br>1 mg – 20 kg E1 weight set. |
| මානමිතිය | Standard Gauge block (0.5 mm to 100 mm), Grade K<br>Linear and Angle Calibrator with LASER Standards (He, Ne) |
| කාලය හා සංඛ්‍යාතය | Cs – Primary Frequency stranded. |
| උෂ්ණත්වය | 7 fixed points cover Mercury triple point to Al freezing point (-39 $^{0}$C to 660 $^{0}$C) |
| සරළධාරා/ප්‍රත්‍යාවර්ථධාරා පරිවර්තනය | Transfer standard; up to1000 V and 20 A |
| **පීඩනය** | Hydraulic pressure balance range 200 MPa<br>Pneumatic pressure balance range 7 MPa |
| **පරිමාව** | Micro pipette calibration unit (1µl to 1ml)<br>Volumetric Standards up to 150 L |
| විද්‍යුත් ජවය හා ශක්තිය | Phase Comparator (10 mA to 120 A) |
| රසායනික මිනුම් | Secondly Standard Buffer Solutions |
| සරළධාරා විද්‍යුතය | DC – Zener DC voltage 1 V,10 V reference<br>Resistance Standards 1 Ω,10 kΩ |

### 2.1.2 මිනුම් (Measurement) අන්වේෂණතාව (Traceability) ස්ථාපනය කිරීම

එක්සත් රාජධානියේ ජාතික මිනුම් විද්‍යාගාරය වන NPL හිදී දිග පිළිබඳ සම්මත ceramic gauge block set (Grade K/00) නැවත අංක ශෝධනය කර දිග පිළිබඳ අන්වේෂණතාව ස්ථාපිත කරන ලදි.

### 2.1.3 අන්තර් සංසන්දනය සඳහා සහභාගී වීම (Inter Laboratory comparisons)

**දේශීය අන්තර් සංසන්දන**

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව විසින් ජර්මනියේ PTB හි තාක්ෂණික සහාය යටතේ 0 $^0$C සිට 100 $^0$C පරාසයේ ඇති විදුරු තුල උෂ්ණත්වමාන (LIGT) අංකශෝධනය කිරීම සඳහා අන්තර් සංසන්දනයක් සංවිධානය කරන ලදී. මෙම සංසන්දනයේ පරමාර්ථය වීදුරු උෂ්ණත්වමාන අංකශෝධනය කිරීමේ විවිධ ක්‍රියා පටිපාටි හා ක්‍රම මගින් ලබාගත් ප්‍රතිඵලවල සමානතාව තක්සේරු කිරීමයි. මෙම සන්සන්දනය සඳහා 0 $^0$C සිට 50 $^0$C සහ 50 $^0$C සිට 100 $^0$C දක්වා පරාසයක වීදුරු උෂ්ණත්වමාන (LIGT) දෙකක් ජර්මනියේ PTB ආයතනයෙන් ලැබුණි. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව මෙම සංසන්දනය සඳහා සාර්ථකව සහභාගී වූ අතර මිනුම් ප්‍රතිඵල ඇගයීම සඳහා සහභාගී වූ විද්‍යාගාර ජර්මනිය PTB ආයතනය වෙත ප්‍රතිඵල වාර්තා කළ යුතුය.

### 2.1.4 ජාත්‍යන්තර ක්‍රමයේ ඒකක (SI) පවත්වාගැනීම




2018 නොවැම්බර් 16 වන දින පැවති පඩි හා මිම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ 26 වන සැසිවාරයේදී (**CGPM**) දැනට භාවිත **SI** මූල ඒකකවල අර්ථ දැක්වීම් සංශෝධනය කිරීමට තීරණය කරන ලදි .ඒ අනුව කිලෝග්‍රෑම්, ඇම්පියර්, කෙල්වින් සහ මවුලය යන මූල ඒකකවල අර්ථ දැක්විම වෙනස් කරමින් **SI** ඒකක සංශෝධනය කිරීම සඳහා එකඟත්වයට පැමිණෙන ලදි .

මෙම තීරණය අනුව **2019** මැයි **20** ලෝක මිනුම් විද්‍යා දිනයේ සිට සියලුම **SI** ඒකක ස්වාභාවික ලෝකය විස්තර කරන නියතයන් අනුව දක්වන ලද නව **SI** මූල ඒකක අර්ථ දැක්වීම් භාවිතා කිරීම ආරම්භ කළ යුතු බව තීරණය කර ඇත . මෙමඟින් **SI** ඒකක පද්ධතියේ අනාගත ස්ථායිතාව සහතික කෙරෙන අතර ක්වොන්ටම් තාක්ෂණය ඇතුළු නව තාක්ෂණයන් භාවිතා කිරීමට අවස්ථාවන්ද විවෘත වේ. **SI** ඒකක නිර්වචන වන නියතයන් හත වගුව 3හි දක්වා ඇත.

**වගුව 3:** SI මුල ඒකක හතේ නව අර්ථ දැක්වීම්වලට යොදා ගන්නා මූලික භෞතික නියතයන් හත

| **නියතය** | **සලකුණ** | **සංඛ්‍යාත්මක අගය** | **ඒකක** |
|---|---|---|---|
| Cs පරමාණුවේ භූමි අවස්ථාවේ අධි සූක්ෂම මට්ටම් අතර සංක්‍රමණයට අනුරූප විකිරණයෙහි කාලාවර්ත | $\Delta_{Cs}$ | 9 192 631 770 | Hz |
| රික්තකයේදී ආලෝකයේ වේගය | c | 299 792 458 | $m\ s^{-1}$ |
| ප්ලාන්ක් නියතය | h | $6.626\ 070\ 15 \times 10^{-34}$ | J s |
| මූලික ආරෝපණය | e | $1.602\ 176\ 634 \times 10^{-19}$ | C |
| බෝල්ස්මාන් නියතය | k | $1.380\ 649 \times 10^{-23}$ | $J\ K^{-1}$ |
| ඇවගාඩ්රෝ  නියතය | $N_A$ | $6.022\ 140\ 76 \times 10^{23}$ | $mol^{-1}$ |
| ප්‍රදීපන සඵලත්වය | $K_{cd}$ | 683 | $lm\ W^{-1}$ |

SI ඒකක අර්ථ දැක්වීම:

**The second**

The second, symbol s, is the SI unit of time. It is defined by taking the fixed numerical value of the cesium frequency $\Delta V_{Cs}$, the unperturbed ground-state hyperfine transition frequency of the caesium-133 atom, to be 919 631770 when expressed in the unit Hz, which is equal to $s^{-1}$.

**The metre**

The metre, symbol m, is the SI unit of length. It is defined by taking the fixed numerical value of the speed of light in vacuum *c* to be 299 792 458 when expressed in the unit $m\ s^{-1}$, where the second is defined in terms of the caesium frequency $\Delta V_{Cs}$.

**The kilogram**

The kilogram, symbol kg, is the SI unit of mass. It is defined by taking the fixed numerical value of the Planck constant *h* to be $6.626\ 070\ 15 \times 10^{-34}$ when expressed in the unit J s, which is equal to $kg\ m^2\ s^{-1}$, where the metre and the second are defined in terms of *c* and $\Delta V_{Cs}$.

## The ampere

The ampere, symbol A, is the SI unit of electric current. It is defined by taking the fixed numerical value of the elementary charge *e* to be 1.602 176 634 x $10^{-19}$ when expressed in the unit C, which is equal to A s, where the second is defined in terms of $\Delta V_{Cs}$.

## The kelvin

The kelvin, symbol K, is the SI unit of thermodynamic temperature. It is defined by taking the fixed numerical value of the Boltzmann constant *k* to be 1.380 649 x $10^{-23}$ when expressed in the unit J $K^{-1}$, which is equal to kg $m^2$ $s^{-2}$ $K^{-1}$, where the kilogram, metre and second are defined in terms of *h*, *c* and $\Delta V_{Cs}$.

## The mole

The mole, symbol mol, is the SI unit of amount of substance. One mole contains exactly 6.022 140 76 x $10^{23}$ elementary entities. This number is the fixed numerical value of the Avogadro constant, $N_A$, when expressed in the unit $mol^{-1}$ and is called the Avogadro number.

The amount of substance, symbol n, of a system is a measure of the number of specified elementary entities. An elementary entity may be an atom, a molecule, an ion, an electron, any other particle or specified group of particles.

## The candela

The candela, symbol cd, is the SI unit of luminous intensity in a given direction. It is defined by taking the fixed numerical value of the luminous efficacy of monochromatic radiation of frequency 540 x $10^{12}$ Hz, $K_{cd}$, to be 683 when expressed in the unit lm $W^{-1}$, which is equal to cd sr $W^{-1}$, or cd sr $kg^{-1}$ $m^{-2}$ $s^3$, where the kilogram, metre and second are defined in terms of *h*, *c* and $\Delta_{Cs}$.

අන්තර් ජාතික ඒකක ක්‍රමය මුලික ඒකක හතක් මඟින් හා එම මුලික ඒකක හතේ ගුණිත බල මඟින් සැදෙන ව්‍යුත්පන්න ඒකක මඟින් ද අර්ථ දක්වා තිබිණි. එම මුලික ඓතිහාසික හේතූන් මත පදනම්ව, සම්ප්‍රදායක් වශයෙන් මාන අනුව ස්වායත්ව වන සේ තෝරාගෙන තිබිණි. ඒවා මීටරය, කිලෝග්‍රෑමය, තත්ත්පරය, ඇම්පියරය, කෙල්විනය, මවුලය, හා කැන්ඩේලාව වේ. අන්තර්ජාතික ඒකක ක්‍රමයේ කාර්යයන් නව අන්තර්ජාතික ඒකක ක්‍රමය සඳහා ද අදාල වන නමුත් ඉහත පරිදි නියතයන් ආධාරයෙන් අර්ථ දක්වා ඇත.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 2018 ලෝක මිනුම් විද්‍යා දිනය සැමරීමෙහි එක් අංගයක් වශයෙන් තාක්ෂණික වැඩසටහනක් සංවිධානය කළේය. “විද්‍යාව හා කර්මාන්ත සඳහා සංශෝධිත අන්තර්ජාතික ඒකකයන්ගේ බලපෑම” යන මාතෘකාව යටතේ දකුණු කොරියාවේ ප්‍රමිති හා විද්‍යාව පිළිබඳ කොරියා පර්යේෂණ ආයතනයේ ආචාර්ය එච්.එස්. ලී මහතා විසින් දේශනයක් පවත්වන ලදී.එම වැඩසටහන හෝමාගම පිහිටි මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවේ ශ්‍රවණාගරයේදී පැවැත්විණි.

## 2.1.5 ශ්‍රී ලංකාවේ සම්මත වේලාවේ නිපදවීම සහ විකාශය

ශ්‍රී ලංකාවට සම්මත වේලාව සැපයීමේ පුරෝගාමියා වීමේ ගෞරවය හිමිවන්නේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවටයි. දිවයින පුරා කාලය පිළිබඳ ඒකමිතියක් ඇති කරනු පිණිස ජාතික මිනුම් පර්යේෂණාගාරයේ විද්‍යුත් කාලය හා සංඛ්‍යාත විද්‍යාගාරයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ සම්මත වේලාව නිපදවීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඒ සඳහා රුබීඩියම් පරමාණුක ඔරලෝසුවක් ස්ථාපිත කර එමගින් ජාත්‍යන්තර කාල ඛණ්ඩාංකවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව සකස් කර විකාශය කිරීම සිදුවේ. නිවැරදි වේලාව විකාශනය සඳහා 2011 අප්‍රේල් මස www.sltime.org වෙබ් අඩවිය විවෘත කරන ලදි. දවසේ ඕනෑම වේලාවක මෙම වෙබ් අඩවියට පිවිස ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව දැනගැනීමේ පහසුව දැන් ශ්‍රී ලාංකිකයන්ට ලැබී ඇත. මෙම වෙබ් අඩවිය ඇසුරෙන් තමන් භාවිතා කරන ඔරලෝසුවල වේලාව නිවැරදිව සකස් කර ගන්නා ලෙස අදාල සියලු පාර්ශවයකටම උපදෙස් දෙනු ලැබේ.

වර්තමානයේ කාලය මැනීමේ පද්ධතිය සීසියම් ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රමිතියෙන් සමන්විත වේ. කාල පද්ධතිය අංකශෝධනය කර ඇති අතර දැන් BIPM හි UTC (ජාත්‍යන්තර සම්මත වේලාව) තීරණය කිරීමට දායක වේ. අන්වේෂණය (Traceability) ලබා ගැනීම සමග කාල සම්බන්ධතාවය ස්ථාපිත කර ඇත. NTP (ජාල කාල ප්‍රොටොකෝලය) සේවාදායකයන්ට නිවැරදි වේලාව බෙදා හැරීම සඳහා යාවත්කාලීන කරන ලදි.

## 2.1.6 පර්යේෂණ හා සංවර්ධනය

### CPEM 2018

යථාතථ්‍ය විද්‍යුත් චුම්භක මිනුම් පිළිබඳ සම්මන්ත්‍රණය (Conference on Precision Electromagnetic Measurements-CPEM) යනු ඉහළම නිරවද්‍යතා මට්ටම්වල විද්‍යුත් චුම්භක මිනුම් පිළිබඳ වැදගත්ම විද්‍යාත්මක හා තාක්ෂණික සමුළුවයි. CPEM සඳහා සහභාගීවූවන් ජාතික මිනුම් විද්‍යා ආයතනවලින් මෙන්ම විශ්ව විද්‍යාලවල නිරවද්‍ය මිනුම් පිළිබඳ පර්යේෂකයන්ගෙන්ද කර්මාන්ත ක්ෂේත්‍රයේ හා රජයේ ප්‍රමිති පිළිබඳ විද්‍යාගාරවල මිනුම් විද්‍යාඥයින්ගෙන්ද සමන්විතය. CPEM 2018 සඳහා රටවල් 50 කින් 500 ක් පමණ විද්‍යාඥයින් පිරිසක් ලියාපදිංචි වී තිබුණි. සමුළුව පැවතියේ පැරිසියේය .

CPEM 2018 සම්මේලනයේදී මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ආචාර්ය ජී.ඩබ්.සී.විජයසුන්දර මෙය විසින් වාචික ඉදිරිපත් කිරීමක් සිදුකර ඇත. එහි මාතෘකාව වූයේ "Calibration of AC Voltage for a High Speed Sampling ADC Board Using Thermal Voltage Converters" යන්නයි. මෙය කොරියාවේ ප්‍රමිති විද්‍යාව පිළිබඳ පර්යේෂණාගාරයේ (KRISS) ආචාර්ය හියුන්ග්-කී ලී, ආචාර්ය මුන් සෙයොග් කිම් හා ආචාර්ය සියුං-නැම් පාර්ක්ගේද සහයෝගය ඇතිව සිදුකරන ලද්දකි.

මෙය වෙළඳපොළෙහි ඇති ප්‍රතිසම - සංඛ්‍යාංක පරිවර්තක (Analog to Digital Converter, ADC) තාප වෝල්ටීයතා පරිවර්තක (Thermal Voltage Converter) ආශ්‍රයේ ප්‍රමිතිය ලෙස යොදාගැනීම සහ එමගින් විවිධ නියැදි මට්ටම් භාවිතා කරමින් 1 MHz සංඛ්‍යාතය පරාසයක් දක්වා අංකශෝධනය කරන අයුරු විස්තර කරයි.

## SLASS 2018

මෙම පර්යේෂණයේදී කාලය පිළිබද ජාතික ප්‍රමිතිය වාණිජ සීසියම් පරමාණුක ඔරලෝසුවක් මඟින් ස්ථාපනය කරන ලදී. (මෙම පද්ධතියේ අන්වේෂණතා අවශ්‍යතාවය බහු නාලිකා ගෝලීය සංචාලන චන්ද්‍රිකා පද්ධතිය (GNSS) කාල හුවමාරු ග්‍රාහකයක් හා Work Ring වර්ගයේ ඇන්ටෙනාවක් භාවිතයෙන් සිදුකරන ලදී.) කාලය පිළිබද සංසන්දනාත්මක දත්ත කාලය හා සංඛ්‍යාතය පිළිබද ජාත්‍යන්තර උපදේශන කමිටුව (CCTF) මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම උපදේශන කණ්ඩායමේ කාලය හුවමාරු කිරීමේ ප්‍රමිතින් (CGGTTS) අනුව ජාත්‍යන්තර පඩි හා මිමි පිළිබඳ කාර්යංශය (BIPM) වෙත දෛනිකව මූලික සංසන්දන පිළිබඳ දත්ත සමුච්ත (KCDB) වල කාලය පිළිබඳ චක්‍රලේඛයට ඇතුලත් කිරීමට හැකිවන පරිදි සිදුකරන ලදී. මෙහිදී ඇන්ටනාවේ පිහිටීමේ නිවරදිතවයට බහු නාලිකා ගෝලීය සංචාලන චන්ද්‍රිකා පද්ධතිය නිවැරදි ස්ථානීය ක්‍රමවේදය (GNSS) භාවිතයෙන් ග්‍රාහක ස්වාධීන හුවමාරු (RINEX) ආකාරයට සැකසූ නිරීක්ෂණ දත්ත ලිපිගොනු ක්‍රියාවලියකට භාජනය කිරීම සිදුකරන ලදි. මෙහිදී තවදුරත් කේබල් වල සිදුවන සීසියම් පරමාණුව පිළිබඳ වර්ගීකරණය ,පාලනය කිරීම සිදුකරමින් ජාත්‍යන්තරව පිළිගත් විචල්‍යතා සීමාවන් ලගාකර ගැනීම සඳහා සීරුමාරු කිරීම සිදුකරන ලද අතර ශ්‍රී ලංකා වේලාව ජාත්‍යන්තර වේලාව සමග දෛනික විචලතාවය (නැනෝතත්පර ± 10) හා VTS කාලය සමග එකගතාවය නැනෝතත්පර ±1100 ලෙස පවත්වාගැනීම කෙරේ.

## 2.2 කාර්මික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

ව්‍යවහාරික මිනුම් විද්‍යාව නමින් ද හදුන්වන මේ විෂයය කොටස යටතේ මිනුම් විද්‍යාව කර්මාන්ත හා නිෂ්පාදන කටයුතුවලදී යොදා ගන්නා ආකාරය පිළිබඳව සලකනු ලැබේ. මිනුම් උපකරණ භාවිතයේ යෝග්‍යතාව සහතික කරමින් ඒවා කර්මාන්ත ආදී ක්ෂේත්‍රවලදී යොදාගැනීමත්, මිනුම්වල තත්ව පාලනය කටයුතු කිරීමත්, කාර්මික මිනුම් විද්‍යාවට අදාලවේ. එහිදී ගුණාත්මක නිෂ්පාදන ක්‍රියාවලියක අවශ්‍යතාවලට අනුකූලවන පරිදි කර්මාන්ත අංකශෝධන කටයුතු හා මිනුම් උපකරණ කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

කාර්මික මිනුම් විද්‍යාවට අදාළ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන සේවා පහත පරිදි වේ.

1. කර්මාන්තවල භාවිතා කරන මිමි සහ මිනුම් උපකරණ අංකශෝධනය කිරීම (පරීක්ෂණාගාරය තුළ සහ බාහිර අංකශෝධනය ද ඇතුළත්ව)
2. නිෂ්පාදන හා සේවා කර්මාන්තවල පිහිටුවා ඇති විශාල පරිමාණයේ මිනුම් උපකරණ පද්ධති පරික්ෂා කිරීම
3. කර්මාන්ත මිනුම්වලට අදාල මිනුම් ගැටලු විසදීම පිළිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම

### 2.2.1 කාර්මික අංකශෝධනය

කාර්මික, ඉංජිනේරු හෝ වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍රවල භාවිතා වන පීඩනමාන, උෂ්ණත්වමාන, පඩි, තරාදි, දිග මැනීමේ උපකරණ, විදුලි මිනුම් උපකරණ, තෙතමනය මැනීමේ උපකරණ, පරීක්ෂණාගාර කිරුම් තරාදි ආදිය සඳහා අංකශෝධනය පහසුකම් ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) වෙතින් ලබා ගත හැකිය.එවැනි අංකශෝධන සඳහා සහතිකද නිකුත් කරනු ලැබේ.

කාර්මික අංකශෝධනය යනු ජාතික මිනුම් පර්යේෂණාගාර (NML) විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්ගෙන් එකකි. NML විසින් සපයනු ලබන අංකශෝධන විස්තර 4 වගුවේ දක්වා ඇත. අංකශෝධනය ගාස්තු සංශෝධනය කිරීම 2015 ජූලි 2 දිනැති 1921/54 දරන විශේෂ ගැසට් පත්‍රයට අනුව ය. අංකශෝධනය ගාස්තු 2020 වසරේ දී නැවතත් සංශෝධනය කිරීමට නියමිතය.

වගුව 4 : ජාතික මිනුම් පර්යේෂණාගාරය විසින් සපයනු ලබන සේවා

| | විද්‍යාගාරයේ නම | සපයනු ලබන අංක ශෝධන සේවා |
|---|---|---|
| 1 | උෂ්ණත්වමිතික විද්‍යාගාරය | **1.**සායනික උෂ්ණත්වමාන<br>**2.**කාර්මික සහ විද්‍යාගාර උෂ්ණත්වමාන සංඛ්‍යාංක උෂ්ණත්වමාන<br>**3.**තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන සහ ප්‍රතිරෝධ උෂ්ණත්වමාන<br>**4.**වීදුරු තුළ ද්‍රව උෂ්ණත්වමාන<br>**5.**Maximum Registered උෂ්ණත්වමාන<br>**6.**උපරිම අවම උෂ්ණත්වමාන<br>**7.**බිත්ති උෂ්ණත්වමාන<br>**8.**පෘෂ්ඨවල උෂ්ණත්වය මැනීමේ උපකරණ<br>**9.**අධෝරක්ත උෂ්ණත්වමාන<br>**10.**තෙතමනමානය<br>**11.**අධෝරක්ත තෙතමනමානය<br>**12.**සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)<br>**13.**ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)<br>**14.**කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (සංසන්දන ක්‍රමය)<br>**15.**කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය)<br>**16.**උෂ්ණත්වමිතික තාපන (ද්‍රව සහ වියළි)<br>**17.**උෂ්ණත්වමිතික රේඛය<br>**18.**විද්‍යාගාර උදුන්<br>**19.**ඔටොක්ලේව්<br>**20.**ඉන්කියුබේටරය සහ ජල තාපකය<br>**21.**අධිශීතකරණය සහ ශීතකරණය (තනි කුටීර)<br>**22.**ශීත කාමරය (කාමර උෂ්ණත්ව මිනුම්)<br>**23.**තාප ස්වීච/පාලක<br>**24.**සංඛ්‍යාංක ආර්ද්‍රතාමානය<br>**25.**තෙත් හා වියළි බල්බ ආර්ද්‍රතාමානය |
| 2 | විද්‍යුත් ජවය සහ ශක්තිය පිළිබඳ විද්‍යාගාරය | **1.**කිලෝ වොට් පැය මීටරය (එකලා)<br>**2.**කිලෝවොට් පැය මීටරය (තෙකලා)<br>**3.**කිලෝවොට් ඇම්පියර් පැය මීටරය (තෙකලා)<br>**4.**ජංගම විද්‍යුත් බලය/ශක්තිය මැනීමේ උපකරණ (එකලා)<br>**5.**ජංගම විද්‍යුත් බලය/ ශක්තිය මැනීමේ උපකරණ (තෙකලා)<br>**6.**විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (එකලා)<br>**7.**විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (තෙකලා)<br>**8.**විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/එකලා)<br>**9.**විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා)<br>**10.**විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/එකලා/ජංගම)<br>**11.**විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා/ජංගම) |
| 3 | පරිමාමිතික විද්‍යාගාරය | **1.**බෙදුම් රහිත මිනුම්<br>**2.**පරිමාමිතික මිනුම්<br>**3.**මිනුම් සිලින්ඩර<br>**4.**පෝව(ර්) සහ විශාල පරිමා සහිත ටැංකි<br>**5.**මයික්‍රෝ පිපෙට්ටු, පිපෙට්ටු, බියුරෙට්ටු (ලක්ෂ්‍ය 03 ක් සඳහා) |

| | | |
|---|---|---|
| 4 | පීඩන මිනුම් විද්‍යාගාරය | 1.වායු පීඩනමාන සහ සම්ප්‍රේක්ෂක<br>2.හයිඩ්‍රොලික් පීඩන මිනුම් සහ සම්ප්‍රේෂක<br>3.ස්පිග්මෝමැනෝමීටරය<br>4.සංඛ්‍යාංක රුධිර පීඩන මානය |
| 5 | ස්කන්ධමිතික විද්‍යාගාරය | 1.කිරුම් පඩි (OIML E 2 පන්තිය)<br>2.කිරුම් පඩි (OIML F 1 පන්තිය)<br>3.OIML පන්තිය F2/M පන්තිය/සුදු යකඩ කාර්මික කිරුම් පඩි<br>4.අනෙකුත් කාර්මික පඩි<br>5.නිරවද්‍යතා පන්තිය I තරාදි<br>6.නිරවද්‍යාතා පන්තිය II තරාදි<br>7.නිරවද්‍යතා පන්තිය III, IIII තරාදි<br>8.පාලම් තරාදි<br>9.බොත්තම් අදින යන්ත්‍රය<br>10.හෝපර් තුලාව |
| 6 | මානමිතික විද්‍යාගාරය | 1.ආමාන කුට්ටි<br>2.මිනුම්  රූල්<br>3.මිනුම් ටේප්<br>4.කැලිපර්<br>5.මයික්‍රොමීටර්<br>6.උස ආමාන<br>7.දර්ශක ආමාන<br>8.සණකම ආමාන<br>9.බෝර්ගෙජ්<br>10.ෆීලර් ගේජ් |
| 7 | විද්‍යුත් කාලය සහ සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරය | 1.වෝල්ට් මීටර්<br>2.ඇමීටර්<br>3.ඕම් මීටර්<br>4.බහු මීටරය (6.5)<br>5.ප්‍රතිරෝධ<br>6.කාලය/විරාම ඝටිකාව<br>7.සංඛ්‍යාතය/ටැකෝ මීටරය<br>8.දෝලනේක්ෂය<br>9.තරංග ජනකය |
| 8 | රසායනික මිනුම් විද්‍යාගාරය | 1.ඇල්කොහොල් විශ්ලේෂකය<br>2.පීඑච් මීටරය |

වගුව 5 : ජාතික මිනුම් පර්යේෂණාගාරයේ අංක ශෝධන ආදායම් තොරතුරු - 2018 වර්ෂය

| මාසය | ස්කන්ධමිතික විද්‍යාගාරය | | මානමිතික විද්‍යාගාරය | | උෂ්ණත්වමිතික විද්‍යාගාරය | | විද්‍යුතය,කාලය සහ සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරය | | විද්‍යුත් ජවය සහ ශක්තිය පිළිබඳ විද්‍යාගාරය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් |
| ජනවාරි | 70 | 78,500.00 | 12 | 23,500.00 | 9 | 27,050.00 | 0 | 0 | 0 | 0 |
| පෙබරවාරි | 6 | 20,700.00 | 12 | 24,000.00 | 7 | 22,300.00 | 3 | 6,000.00 | 1 | 2,500.00 |
| මාර්තු | 91 | 165,400.00 | 43 | 89,000.00 | 17 | 32,000.00 | 5 | 10,500.00 | 0 | 0 |
| අප්‍රේල් | 51 | 42,800.00 | 8 | 14,500.00 | 4 | 6,050.00 | 0 | 0 | 0 | 0 |
| මැයි | 55 | 55,700.00 | 7 | 13,400.00 | 0 | 0 | 1 | 2,000.00 | 2 | 132,000.00 |
| ජුනි | 54 | 43,600.00 | 17 | 19675.00 | 24 | 41,160.00 | 0 | 0 | 1 | 4,000.00 |
| ජුලි | 77 | 76500.00 | 15 | 25,000.00 | 12 | 27,450.00 | 4 | 11,500.00 | 1 | 600,000.00 |
| අගෝස්තු | 35 | 84,700.00 | 19 | 37,000.00 | 7 | 16,800.00 | 2 | 4,500.00 | 1 | 2,000.00 |
| සැප්තැම්බර් | 93 | 215,000.00 | 21 | 38,000.00 | 3 | 4,750.00 | 5 | 19,500.00 | 0 | 0 |
| ඔක්තෝම්බර් | 61 | 126,400.00 | 18 | 34,500.00 | 0 | 0 | 2 | 4,000.00 | 0 | 0 |
| නොවැම්බර් | 42 | 18,450.00 | 12 | 19,500.00 | 4 | 6,550.00 | 8 | 20,000.00 | 2 | 12,000.00 |
| දෙසැම්බර් | 150 | 317,600.00 | 4 | 7,500.00 | 12 | 31,410.00 | 2 | 2,250.00 | 3 | 122,500.00 |
| **එකතුව** | **785** | **1,245,560.00** | **188** | **347,075.00** | **99** | **215,510.00** | **32** | **80,250.00** | **11** | **335,000.00** |

| මාසය | පරිමාමිතික විද්‍යාගාරය | | පීඩන මිනුම් විද්‍යාගාරය | | රසායනික විද්‍යාගාරය | | වේගමාපක උපකරණ සත්‍යායනය | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් | ඒකක ගණන | ආදායම රුපියල් |
| ජනවාරි | 3 | 3,400.00 | 2 | 3,000.00 | 9 | 40,000.00 | 15 | 30,000.00 |
| පෙබරවාරි | 0 | 0 | 8 | 48,000.00 | 3 | 15,000.00 | 1 | 2000.00 |
| මාර්තු | 1 | 900.00 | 14 | 21,000.00 | 3 | 15,000.00 | 3 | 6,000.00 |
| අප්‍රේල් | 0 | 0 | 0 | 0 | 5 | 25,000.00 | 1 | 2,000.00 |
| මැයි | 7 | 5,700.00 | 2 | 3,000.00 | 5 | 25,000.00 | 0 | 0 |
| ජුනි | 0 | 0 | 2 | 7,000.00 | 5 | 25,000.00 | 0 | 0 |
| ජුලි | 3 | 3,500.00 | 6 | 9,000.00 | 1 | 5,000.00 | 1 | 2,000.00 |
| අගෝස්තු | 0 | 0 | 5 | 7,500.00 | 0 | 0 | 0 | 0 |
| සැප්තැම්බර් | 0 | 0 | 8 | 12,000.00 | 0 | 0 | 0 | 0 |
| ඔක්තෝම්බර් | 0 | 0 | 1 | 1,500.00 | 0 | 0 | 6 | 12,000.00 |
| නොවැම්බර් | 0 | 0 | 23 | 34,500.00 | 0 | 0 | 3 | 6,000.00 |
| දෙසැම්බර් | 2 | 2,300.00 | 2 | 3,800.00 | 1 | 5,000.00 | 5 | 10,000.00 |
| **එකතුව** | **16** | **15,800.00** | **73** | **150,300.00** | **32** | **155,000.00** | **35** | **70,000.00** |

### 2.2.2 පුහුණු සහ උපදේශන

කාර්මික මිනුම් විද්‍යා ක්ෂේත්‍රයට අවශ්‍ය පුහුණු අවස්ථා ලබා දීම සඳහා වැඩසටහන් මාලාවක් 2018 දී දියත් කරන ලදී. මේ වන විට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD)හි මිනුම් අවිනිශ්චිතතාව ගණනය කිරීම (Uncertainty Calculations) පිළිබඳ පුහුණුව ලබා දීමට ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් අප සතුව ඇත. 2018 දී පවත්වන ලද එවැනි පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වගුව 6 : 2018 වසරේ ජාතික මිනුම් විද්‍යාගාරය මඟින් පැවැත්වූ පුහුණු සහ උපදේශනය වැඩසටහන්

| පාඨමාලාව | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|
| බාහිර පරීක්ෂණාගාර සඳහා අංකශෝධන සහ මිනුම් සංශයතා ගණනය කිරීම | 29 |
| ශ්‍රී ලංකා ප්‍රතීතණ මණ්ඩලය (SLAB)සඳහා ISO 17025 හි ඇති මිනුම් විද්‍යාත්මක ලක්ෂණ | 42 |
| සීමාසහිත එස්.ජී.එස්. ලංකා ආයතනය සඳහා මිනුම් විද්‍යා පුහුණුව | 5 |
| ඇෆ්ගන් නෛතික මිනුම් ආයතනය සඳහා නෛතික මිනුම් විද්‍යා පුහුණුව | 1 |
| වවුනියා විශ්වවිද්‍යාලයේ මිනුම් විද්‍යා දැනුවත් කිරීමේ වැඩසටහන | 50 |
| කාර්මික අංකශෝධන හා සේවා මධ්‍යස්ථානය (පුද්ගලික) සමාගම සඳහා මිනුම් විද්‍යා පුහුණුව | 9 |
| **එකතුව** | **136** |

## 2.3 නෛතික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

නෛතික පාලනය යටතට ගැනෙන ක්ෂේත්‍රය නෛතික මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. එනම් මිනුම් හා මිනුම් උපකරණ භාවිතයේදී සපුරාලිය යුතු නෛතික අවශ්‍යතා පරීක්ෂා කර රටේ පවතින මිනුම් නීතිවලට අනුකූල බවට සහතික කිරීමේ ක්‍රියාවලියයි. ඒ සඳහා 1995 අංක 35 දරණ පනත මඟින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සපයා ඇත. ඒ අනුව සෞඛ්‍යය, මහජන ආරක්ෂාව, පරිසර ආරක්ෂණය, බදුකරණය, පාරිභෝගික රැකවරණය සහ සාධාරණ වෙළඳාම යන අංශ සැලකිල්ලට ගෙන පණවනු ලබන නීති හා රෙගුලාසි නියාමනය කිරීම සිදුවේ.

නෛතික මිනුම් විද්‍යා විෂය ක්ෂෙත්‍රයට අදාලව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්යයන් පනත සහ එහි ඇතුළත් නියෝග මඟින් අර්ථකථනය කොට ඇත. සෑම වාණිජ කටයුත්තකදීම සිදු කරන කිරුම්, මිනුම් ආදිය මිනුම් නීතියට යටත්වේ. ඒ අනුව පහත සඳහන් නියාමන කාර්යයන් සිදුකිරීම සඳහා පනත මඟින් දෙපාර්තමේන්තුවට බලය පවරා තිබේ.

01. ක්‍රියාකාරි ප්‍රමිති අංක ශෝධනය කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාකාරි ප්‍රමිති පවත්වාගෙන යාම (පනතට අනුව සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙකුම මිනුම් සේවා අධිකාරි තනතුර හොබවන අතර ක්‍රියාකාරි ප්‍රමිතීන් ඔහු භාරයේ ඇත.)

02. වෙළඳාමේදී භාවිතා කෙරෙන සියලුම පඩි, මිම්, කිරුම් හා මිනුම් උපකරණවල මූලික හා වාර්ෂික සත්‍යායන කටයුතු

03. වෙළඳාමේදී භාවිතා කෙරෙන සියලුම පඩි, මිම්, කිරුම් හා මිනුම් උපකරණ නිෂ්පාදනය කරන්නන්, ආනයනය කරන්නන්, අලුත්වැඩියා කරන්නන් හා අලෙවි කරන්නන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම.

04. පනතේ දක්වා ඇති දණ්ඩන විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින් පාරිභෝගික ආරක්ෂාව සැලසීම

05. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ වෙළෙන්දන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම

06. වෙළඳාමේදී සහ කර්මාන්ත අංශයන්හි භාවිතා කරන කිරුම් හා මිනුම් උපකරණවල මාදිලි අනුමත කිරීම (ජාතික මිනුම් පර්යේෂණාගාරය මෙම සේවාව ලබා දෙයි)

07. පෙර ඇසුරුම් (Pre packages) පරීක්ෂා කිරීම හා පාලනය කිරීම

08. මාර්ග ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ මිනුම් උපකරණ සත්‍යායනය කිරීම

09. වෙළෙඳපොළ වැටලීම් සිදුකර කිරුම්, මිනුම් වංචා කරන පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම

## 2.3.1 ක්‍රියාකාරී ප්‍රමිති නැවත සත්‍යායනය කිරීම

වෙළඳ කටයුතු හා කර්මාන්තවලදී භාවිතා කරන කිරුම් මිනුම් උපකරණ සත්‍යායනය කිරීම සඳහා යොදාගන්නා ක්‍රියාකාරී ප්‍රමිතීන් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් ලේකම්වරයා යටතේ පවත්වාගෙන යයි. මෙම ප්‍රමිතීන් වසර දෙකකට වරක් අංකශෝධන කළයුතුය. එම අංක ශෝධන කාර්යය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සිදු කරනු ලැබේ. සම්මත පඩි, පරිමා මිනුම් සහ දිග මිනුම් මෙම ක්‍රියාකාරී ප්‍රමිතීන් වශයෙන් සලකනු ලැබේ.

## 2.3.2 මාදිලි අනුමැතිය

මාදිලි අනුමැතිය යනු කිසියම් පඩියක්, මිම්මක්, කිරුම් හෝ මිනුම් උපකරණයක් නිෂ්පාදකයකු විසින් වෙළඳපොළට එවීමට හෝ ආනයනකරුවකු විසින් ගෙන්වා විකිණීමට පෙර එය ලංකාවේ ක්‍රියාත්මක වන මිනුම් පිළිබඳ නීතිරීතිවලට අනුකූල වන්නේද යන්න සුදුසුකම්ලත් පරීක්ෂණාගාරයකින් පරීක්ෂා කරවාගෙන අනුමත කර ගැනීමයි. මාදිලි අනුමත කිරීම තාක්ෂණික පරීක්ෂාවක් වේ. එහිදී මිනුම් උපකරණයේ මූලාකෘතිය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සම්පූර්ණ පරීක්ෂාවට ලක් කෙරේ. එහිදී මිනුම් උපකරණයේ එක් එක් කොටස් නිර්මාණය කර ඇති ආකාරය අන්තර් ජාතික නෛතික මිනුම් විද්‍යා සංවිධානයේ (International Organization of Legal Metrology, OIML) නිර්ණායකවලට අනුකූලද යන්න සොයා බැලේ. පරීක්ෂණ ප්‍රතිඵල ඇගයීම මත පදනම්ව, පඩි, වාහන විමෝචන පරීක්ෂණ ඒකක සහ ඉන්ධන පිරවුම් යන්ත්‍ර ඇතුළු මිනුම් උපකරණ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) විසින් මාදිලි අනුමැතිය ලබා දෙනු ලැබේ (උපග්‍රන්ථය 1).

වගුව 7 : පඩි,මිම්,කිරුම් හා මිනුම් උපකරණ මාදිලි අනුමැතිය - 2018 වර්ෂය

| මාදිලි අනුමැති වර්ගය | ඒකක සංඛ්‍යාව |
|---|---|
| ඉලෙක්ට්‍රොනික් කිරුම් උපකරණ | 67 |
| පරිමාමිතික මිම් | 1 |
| ඉන්ධන පිරවුම් යන්ත්‍ර | 10 |
| කුලී රථ මනු (Taxi Meters) | 2 |
| වාහන දුම් පරීක්ෂණ ඒකක (Vehicle Emission) | 1 |
| ඇල්කොවයිසර් | 2 |
| **එකතුව** | **83** |

## 2.3.3 දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයවන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායනය කිරීම්, පරීක්ෂණ හා වැටලීම්

රට තුළ භාවිතා වන පඩි,මිම්,කිරුම් හා මිනුම් උපකරණ මිනුම් නීතිරීතිවලට අනුකූලව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ හා වැටලීම් සිදු කරනු ලැබේ .මෙම වැඩසටහන් පාරිභෝගික ආරක්ෂාවට මෙන්ම රට තුළ නිවැරදි මිනුම් පද්ධතියක් පවත්වාගෙන යාමටත් උපකාරී වේ.

වෙළඳාමේදී භාවිතා වන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායන කටයුතු සිදු කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශවල සේවයේ නියුතු මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන් (Measurement Servicses and Devices Inspectors) විසිනි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ වෙනත් රාජ්‍ය ආයතනවල සත්‍යායන මධ්‍යස්ථාන පිහිටුවා දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව මෙම කටයුතු සිදු කරනු ලැබේ. තවද සෑම දිස්ත්‍රික්කයකම පිහිටා අති පාලම් තරාදි ද වසරක් පසා මුද්‍රා කිරීම සඳහා පාලම් තරාදි පරීක්ෂා කිරීමේ ජංගම ඒකකයක්(Weighbridge Verification unit) පිහිටුවා තිබේ. රට පුරා ඉන්ධන පිරවුම්හල්වල පිහිටි ඉන්ධන නිකුත් කිරීමේ යන්ත්‍ර ද වසරකට වරක් සත්‍යායනය කිරීම සඳහා ජංගම ඒකකයක් ( Fuel Dispensers Verification Unit) පිහිටුවා ඇත.

වගුව 8 : දිස්ත්‍රික් කාර්යාලවල සම්බන්ධතා තොරතුරු

| දිස්ත්‍රික් කාර්යාලයය | ලිපිනය | දුරකතන අංක |
|---|---|---|
| කොළඹ | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය නාරාහේන්පිට,කොළඹ 5 | 0112-391079 |
| ගම්පහ | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,ගම්පහ | 0332-222900 |
| කළුතර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර | 0342-222635 |
| පුත්තලම | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,පුත්තලම | 0322-266189 |
| කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 0372-222134 |
| කෑගල්ල | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල | 0352-232620 |
| රත්නපුර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,රත්නපුර | 0452-226299 |
| ගාල්ල | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,ගාල්ල | 0912-222233 |
| මාතර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මාතර | 0412-237079 |
| හම්බන්තොට | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,හම්බන්තොට | 0472-256247 |
| මොනරාගල | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මොනරාගල | 0552-277406 |
| බදුල්ල | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,බදුල්ල | 0552-222292 |
| නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,නුවරඑළිය | 0522-222610 |
| මහනුවර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මහනුවර | 0812-222233 |
| මාතලේ | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මාතලේ | 0662-222235 |
| අනුරාධපුර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර | 0252-225190 |
| පොලොන්නරුව | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,පොලොන්නරුව | 0272-226706 |
| මඩකලපුව | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මඩකලපුව | 0652-224465 |
| අම්පාර | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අම්පාර | 0632-222236 |
| වව්නියාව | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,වව්නියාව | 0242-222187 |
| යාපනය | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,යාපනය | 0212-222355 |
| මුලතිවු | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මුලතිව් | 0212-290045 |
| මන්නාරම | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,මන්නාරම | 0232-222232 |
| කිලිනොච්චිය | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කිලිනොච්චි | 0212-285662 |
| ත්‍රිකුණාමලය | දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,ත්‍රිකුණාමලය | 0262-050800 |

වගුව 9 : සත්‍යායන ආදායම් දිස්ත්‍රික් මට්ටමින් නිරූපණය

| දිස්ත්‍රික්කය | **2014 සිට 2018 වසර දක්වා එක් එක් දිස්ත්‍රික්කයෙන් ලබන ලද ආදායම රුපියල්වලින් (සියලු බදු ඇතුළත්ව)** | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| කොළඹ | 58,536,277 | 86,693,931 | 130,712,937 | 136,014,517 | 146,275,819 |
| ගම්පහ | 12,950,324 | 16,271,296 | 27,545,201 | 29,347,519 | 28,316,491 |
| කළුතර | 6,855,189 | 7,978,818 | 11,474,642 | 12,673,950 | 12,854,085 |
| | 78,341,790 | 110,944,045 | 169,732,780 | 178,035,986 | **187,446,395** |
| මහනුවර | 11,139,456 | 14,012,409 | 21,620,097 | 25,313,869 | 26,151,103 |
| මාතලේ | 3,795,006 | 4,520,843 | 7,988,421 | 8,717,368 | 9,116,889 |
| නුවරඑළිය | 5,266,936 | 5,587,098 | 8,584,030 | 9,725,814 | 9,841,753 |
| | 20,201,398 | 24,120,350 | 38,192,548 | 43,757,051 | **45,109,745** |
| ගාල්ල | 5,295,133 | 7,699,509 | 10,977,361 | 12,694,011 | 13,450,025 |
| මාතර | 5,615,023 | 6,693,814 | 10,280,441 | 11,735,600 | 13,838,950 |
| හම්බන්තොට | 4,017,363 | 5,129,383 | 10,119,069 | 11,955,389 | 11,618,500 |
| | 14,927,519 | 19,522,706 | 31,376,871 | 36,385,000 | **38,907,475** |
| මඩකලපුව | 2,373,352 | 3,205,015 | 5,625,221 | 6,508,574 | 6,866,995 |
| අම්පාර | 4,694,333 | 5,006,882 | 7,769,257 | 9,731,150 | 9,549,772 |
| ත්‍රිකුණාමලය | 1,506,958 | 1,991,689 | 3,789,316 | 3,640,751 | 4,311,200 |
| | 8,574,643 | 10,203,586 | 17,183,794 | 19,880,475 | **20,727,967** |
| කුරුණෑගල | 11,990,847 | 13,817,069 | 23,779,336 | 23,919,321 | 24,484,601 |
| පුත්තලම | 4,511,899 | 5,743,748 | 9,201,545 | 10,322,464 | 10,535,156 |
| | 16,502,746 | 19,560,817 | 32,980,881 | 34,241,785 | **35,019,757** |
| අනුරාධපුරය | 7,337,244 | 8,992,501 | 14,846,516 | 16,459,826 | 16,642,244 |
| පොළොන්නරුව | 3,816,287 | 4,717,437 | 8,266,819 | 7,563,883 | 8,005,081 |
| | 11,153,531 | 13,709,938 | 23,113,335 | 24,023,709 | **24,647,325** |
| බදුල්ල | 6,509,075 | 8,148,777 | 11,924,573 | 14,580,367 | 14,739,389 |
| මොණරාගල | 3,784,969 | 4,638,176 | 8,090,344 | 7,966,717 | 8,570,731 |
| | 10,294,044 | 12,786,953 | 20,014,917 | 22,547,084 | **23,310,120** |
| රත්නපුර | 11,800,266 | 8,539,852 | 12,504,982 | 13,974,267 | 15,362,254 |
| කෑගල්ල | 5,363,518 | 7,355,280 | 10,555,329 | 9,582,340 | 10,847,639 |
| | 17,163,784 | 15,895,132 | 23,060,311 | 23,556,607 | **26,209,893** |
| මුලතිවු | 339,203 | 408,207 | 734,486 | 835,337 | 877,496 |
| මන්නාරම | 328,231 | 370,549 | 667,173 | 835,717 | 849,815 |
| කිළිනොච්චිය | 372,175 | 461,692 | 982,477 | 1,023,661 | 1,140,455 |
| යාපනය | 2,117,287 | 2,778,039 | 5,033,464 | 5,627,755 | 6,014,086 |
| වව්නියාව | 956,032 | 1,317,567 | 2,201,828 | 2,314,271 | 2,480,895 |
| | 4,112,928 | 5,336,054 | 9,619,428 | 10,636,741 | **11,362,747** |
| **එකතුව** | **181,272,383** | **232,079,581** | **365,274,865** | **393,064,438** | **412,741,424** |

වගුව 10 : සත්‍යායන කරන ලද ඒකක සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් නිරූපණය

| දිස්ත්‍රික්කය | සත්‍යායනය කරන ලද ඒකක සංඛ්‍යාව (වර්ෂ 2014 සිට 2018 දක්වා) | | | | |
|---|---|---|---|---|---|
| | **2014** | **2015** | **2016** | **2017** | **2018** |
| කොළඹ | 183,608 | 177,201 | 167,897 | 129,812 | 129,481 |
| ගම්පහ | 48,956 | 46,671 | 39,706 | 36,022 | 33,278 |
| කළුතර | 29,538 | 29,762 | 27,201 | 26,900 | 23,129 |
| | 262,102 | 253,634 | 234,804 | 192,734 | 185,888 |
| මහනුවර | 82,709 | 76,426 | 71,353 | 61,791 | 63,067 |
| මාතලේ | 30,490 | 24,362 | 23,383 | 20,920 | 19,984 |
| නුවරඑළිය | 28,328 | 25,333 | 22,165 | 18,149 | 18,044 |
| | 141,527 | 126,121 | 116,901 | 100,860 | 101,095 |
| ගාල්ල | 40,472 | 37,758 | 34,061 | 25,127 | 29,637 |
| මාතර | 37,916 | 33,401 | 30,289 | 28,275 | 28,695 |
| හම්බන්තොට | 29,049 | 27,902 | 26,954 | 25,477 | 23,290 |
| | 107,437 | 99,061 | 91,304 | 78,879 | 81,622 |
| මඩකලපුව | 29,353 | 27,639 | 29,510 | 28,680 | 27,978 |
| අම්පාර | 38,728 | 32,722 | 29,614 | 28,075 | 23,991 |
| ත්‍රිකුණාමලය | 13,098 | 12,285 | 12,037 | 10,535 | 10,120 |
| | 81,179 | 72,646 | 71,161 | 67,290 | 62,089 |
| කුරුණෑගල | 84,251 | 68,842 | 61,949 | 52315 | 45,699 |
| පුත්තලම | 27,897 | 26,420 | 22,071 | 18,703 | 16,989 |
| | 112,148 | 95,262 | 84,020 | 70,388 | 62,688 |
| අනුරාධපුරය | 37,158 | 35,569 | 32,028 | 36,554 | 28,740 |
| පොළොන්නරුව | 20,674 | 18,467 | 16,288 | 13,886 | 12,478 |
| | 57,832 | 54,036 | 48,316 | 50,440 | 41,218 |
| බදුල්ල | 37,990 | 31,823 | 30,292 | 29,162 | 26,821 |
| මොණරාගල | 31,947 | 31,434 | 29,699 | 27,420 | 24,816 |
| | 69,937 | 63,257 | 59,991 | 56,582 | 51,637 |
| රත්නපුර | 49,954 | 53,708 | 38,470 | 35,679 | 31,393 |
| කෑගල්ල | 39,790 | 38,255 | 36,454 | 32,268 | 25,725 |
| | 89,744 | 91,963 | 74,924 | 67,947 | 57,118 |
| මුලතිවු | 2,527 | 2,401 | 2,098 | 2,216 | 1,846 |
| මන්නාරම | 1,890 | 1,372 | 1,399 | 1,706 | 1,781 |
| කිලිනොච්චිය | 3,373 | 3,022 | 2,918 | 2,338 | 2,210 |
| යාපනය | 22,010 | 21,792 | 18,486 | 18,604 | 14,060 |
| වව්නියාව | 3,602 | 3,855 | 4,249 | 4,435 | 4,023 |
| | 33,402 | 32,442 | 29,150 | 29,299 | 23,920 |
| **එකතුව** | **955,308** | **888,422** | **810,571** | **714,419** | **667,275** |




රූපය 4: සත්‍යායන  ආදායමේ ප්‍රස්ථාරය




රූපය 5: සත්‍යායනය කළ ඒකක ගණන පිළිබඳ ප්‍රස්තාරය

වගුව 11: සත්‍යායන වැඩසටහන -ආදායම්

| මාසය | ආදායම රුපියල් | | සත්‍යායනය කළ ඒකක සංඛ්‍යාව |
|---|---|---|---|
| | **2017 වර්ෂය** | **2018 වර්ෂය** | **2018 වර්ෂය** |
| ජනවාරි | 32,750,792 | 28,353,563 | 67,238 |
| පෙබරවාරි | 37,286,119 | 29,319,474 | 60,652 |
| මාර්තු | 46,096,427 | 33,556,960 | 72,898 |
| අප්‍රේල් | 21,403,213 | 22,871,425 | 40,866 |
| මැයි | 33,719,060 | 30,345,307 | 52,046 |
| ජූනි | 31,466,599 | 27,055,476 | 52,916 |
| ජූලි | 37,816,919 | 35,191,518 | 53,569 |
| අගෝස්තු | 33,841,286 | 31,057,745 | 57,998 |
| සැප්තැම්බර් | 24,632,156 | 31,814,202 | 58,187 |
| ඔක්තෝබර් | 27,785,059 | 32,066,562 | 58,409 |
| නොවැම්බර් | 33,008,011 | 28,213,454 | 52,635 |
| දෙසැම්බර් | 33,258,797 | 29,059,908 | 39,861 |
| **එකතුව** | **393,064,438** | **358,905,594** | **667,275** |

වගුව 12 : වැටලීම් වැඩසටහන - 2018 වසරේ ප්‍රගතිය

| | වැටලීම් සංඛ්‍යාව | | දඩ මුදල් රුපියල් | | අවසන් වූ නඩු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| **මාසය** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| ජනවාරි | 710 | 776 | 26,500 | 4000 | 17 | 52 |
| පෙබරවාරි | 869 | 724 | 191,000 | 84,500 | 85 | 31 |
| මාර්තු | 1,206 | 703 | 119,000 | 102,000 | 65 | 53 |
| අප්‍රේල් | 818 | 903 | 47,500 | 42,000 | 19 | 43 |
| මැයි | 854 | 983 | 120,000 | 121,500 | 53 | 42 |
| ජූනි | 599 | 1,473 | 80,000 | 115,500 | 54 | 47 |
| ජූලි | 1,899 | 1,509 | 115,000 | 151,000 | 76 | 70 |
| අගෝස්තු | 1,432 | 1,430 | 88,500 | 119,250 | 56 | 50 |
| සැප්තැම්බර් | 1,267 | 1,897 | 204,500 | 131,500 | 120 | 66 |
| ඔක්තෝබර් | 796 | 2,162 | 86,500 | 224,500 | 49 | 120 |
| නොවැම්බර් | 1,055 | 1,070 | 75,000 | 137,000 | 41 | 75 |
| දෙසැම්බර් | 862 | 1,573 | 59,000 | 68,000 | 34 | 28 |
| **එකතුව** | **12,367** | **15,203** | **1,212,500** | **1,300,750** | **669** | **677** |




රූපය 6: වැටලීම් ප්‍රගතිය




රූපය 7: නඩු පැවරීම් ප්‍රගතිය

වගුව13 : දැනුවත් කිරීමේ වැඩසටහන - 2018 වසරේ ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ජනවා. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජුනි | ජුලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය කොළඹ | 3 | 4 | 4 | 0 | 3 | 2 | 2 | 2 | 7 | 6 | 4 | 5 | 37 |
| කොළඹ | 3 | 3 | 3 | 3 | 3 | 5 | 4 | 1 | 14 | 4 | 5 | 6 | 53 |
| ගම්පහ | 3 | 4 | 4 | 5 | 3 | 3 | 6 | 4 | 5 | 6 | 4 | 8 | 59 |
| කළුතර | 2 | 3 | 3 | 2 | 2 | 4 | 3 | 3 | 3 | 0 | 3 | 3 | 28 |
| පුත්තලම | 2 | 3 | 3 | 3 | 5 | 5 | 2 | 3 | 3 | 4 | 4 | 0 | 38 |
| කුරුණෑගල | 3 | 4 | 4 | 3 | 4 | 4 | 4 | 3 | 8 | 7 | 8 | 20 | 61 |
| කෑගල්ල | 2 | 3 | 3 | 0 | 3 | 1 | 3 | 3 | 4 | 0 | 2 | 3 | 24 |
| රත්නපුර | 2 | 3 | 3 | 9 | 14 | 2 | 4 | 3 | 6 | 8 | 4 | 3 | 57 |
| ගාල්ල | 2 | 3 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 0 | 22 |
| මාතර | 2 | 3 | 3 | 6 | 8 | 3 | 6 | 4 | 7 | 5 | 5 | 6 | 59 |
| හම්බන්තොට | 2 | 3 | 3 | 1 | 3 | 3 | 4 | 3 | 8 | 8 | 4 | 4 | 47 |
| මොණරාගල | 2 | 3 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 12 | 12 |

| දිස්ත්‍රික්කය | ජනවා. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බදුල්ල | 2 | 3 | 3 | 4 | 2 | 4 | 4 | 5 | 3 | 3 | 3 | 2 | 46 |
| නුවරඑළිය | 2 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 3 | 2 | 4 | 3 | 6 | 39 |
| මහනුවර | 2 | 3 | 4 | 3 | 6 | 4 | 3 | 1 | 5 | 3 | 3 | 3 | 41 |
| මාතලේ | 2 | 3 | 3 | 2 | 4 | 3 | 3 | 2 | 3 | 3 | 2 | 3 | 25 |
| අනුරාධපුර | 2 | 3 | 3 | 2 | 2 | 4 | 2 | 4 | 4 | 4 | 4 | 4 | 44 |
| පොළොන්නරුව | 2 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 24 |
| ත්‍රිකුණාමලය | 2 | 2 | 3 | 2 | 2 | 1 | 2 | 2 | 2 | 2 | 1 | 3 | 23 |
| මඩකළපුව | 2 | 2 | 3 | 4 | 4 | 4 | 2 | 2 | 2 | 0 | 0 | 0 | 18 |
| අම්පාර | 2 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 2 | 6 | 30 |
| වව්නියාව | 1 | 1 | 2 | 1 | 2 | 4 | 3 | 2 | 4 | 2 | 2 | 2 | 29 |
| යාපනය | 2 | 2 | 3 | 1 | 1 | 0 | 1 | 1 | 2 | 4 | 0 | 1 | 14 |
| මුලතිව් | 1 | 1 | 2 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 2 | 8 |
| මන්නාරම | 1 | 1 | 2 | 2 | 2 | 2 | 2 | 1 | 2 | 0 | 2 | 2 | 18 |
| කිළිනොච්චි | 1 | 2 | 2 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 7 |
| එකතුව | **53** | **69** | **78** | **64** | **83** | **67** | **70** | **60** | **100** | **81** | **71** | **107** | **863** |

වගුව 14: දැනුවත් කිරීමේ වැඩසටහන්වල කාර්තුමය ප්‍රගතිය - 2018 වර්ෂය
(ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව සහ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව)

| දිස්ත්‍රික්කය | ජනවාරි - මාර්තු | | අප්‍රේල් - ජුනි | | ජූලි - සැප්තැම්බර් | | ඔක්තෝ - දෙසැ | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | සාධනය | ඉලක්කය | සාධනය | ඉලක්කය | සාධනය | ඉලක්කය | සාධනය |
| ප්‍රධාන කාර්යාලය | 11 | 6 | 11 | 5 | 11 | 11 | 11 | 15 |
| කොළඹ | 9 | 8 | 9 | 11 | 9 | 19 | 9 | 15 |
| ගම්පහ | 11 | 15 | 11 | 11 | 11 | 15 | 11 | 18 |
| කළුතර | 8 | 5 | 8 | 8 | 8 | 9 | 8 | 6 |
| පුත්තලම | 8 | 9 | 9 | 13 | 8 | 8 | 8 | 8 |
| කුරුණෑගල | 11 | 0 | 11 | 11 | 11 | 15 | 11 | 35 |
| කෑගල්ල | 8 | 5 | 9 | 4 | 8 | 10 | 8 | 5 |
| රත්නපුර | 8 | 4 | 8 | 25 | 9 | 13 | 7 | 15 |
| ගාල්ල | 8 | 6 | 9 | 6 | 8 | 6 | 8 | 4 |
| මාතර | 8 | 9 | 8 | 17 | 9 | 17 | 7 | 16 |
| හම්බන්තොට | 8 | 9 | 9 | 7 | 8 | 15 | 8 | 16 |
| මොණරාගල | 8 | 0 | 8 | 0 | 8 | 0 | 8 | 12 |
| බදුල්ල | 8 | 16 | 9 | 10 | 8 | 12 | 9 | 8 |
| නුවරඑළිය | 8 | 9 | 8 | 9 | 8 | 8 | 7 | 13 |
| මහනුවර | 10 | 10 | 11 | 13 | 10 | 9 | 11 | 9 |
| මාතලේ | 8 | 0 | 8 | 9 | 8 | 8 | 8 | 8 |
| අනුරාධපුර | 8 | 14 | 9 | 8 | 8 | 10 | 8 | 12 |
| පොළොන්නරුව | 7 | 6 | 6 | 6 | 7 | 6 | 6 | 6 |
| ත්‍රිකුණාමලය | 7 | 6 | 7 | 5 | 6 | 6 | 6 | 6 |
| මඩකළපුව | 7 | 0 | 7 | 12 | 6 | 6 | 6 | 0 |
| අම්පාර | 7 | 8 | 7 | 6 | 6 | 6 | 6 | 10 |
| වව්නියාව | 4 | 7 | 5 | 7 | 4 | 9 | 4 | 6 |
| යාපනය | 7 | 3 | 7 | 2 | 8 | 4 | 6 | 5 |
| මුලතිව් | 4 | 2 | 4 | 1 | 5 | 1 | 4 | 4 |
| මන්නාරම | 4 | 3 | 4 | 6 | 5 | 5 | 4 | 4 |
| කිළිනොච්චි | 5 | 0 | 4 | 2 | 4 | 2 | 4 | 3 |
| **එකතුව** | **200** | **160** | **206** | **214** | **201** | **230** | **193** | **259** |

## 2.3.4 පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා කිරීම

පාරිභෝගිකයාට අලෙවි කිරීමට පෙර ඇසුරුම් කරන ලද භාණ්ඩ පෙර ඇසුරුම් භාණ්ඩ (Pre – Packages) ලෙස හැඳින්වේ. පෙර ඇසුරුම් අයිතමයන්ගේ සඳහන්ව ඇති ප්‍රමාණයන් (බර, පරිමාව ආදිය) නියමිත පරිදි තිබෙන බව පරීක්ෂා කිරීමේදී නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යාන්තර සම්මුතීන්ට (OIML regulations) අනුව පරීක්ෂණ සිදු කෙරේ.

පෙර ඇසුරුම් පරීක්ෂා කිරීමේදී වෙළඳ පොළේ ප්‍රදර්ශනයට තබා ඇති පෙර ඇසුරුම්, නියදි ලෙස තෝරා ගෙන ඒවායේ අඩංගු ද්‍රව්‍යවල ශුද්ධ පරිමාව හෝ දිග මනිනු ලැබේ. නිශ්චිත පෙර ඇසුරුම් සංඛ්‍යාවක් එලෙස පරීක්ෂා කර එම මිනුම් සංඛ්‍යාන විශ්ලේෂණයකට (Statistical Analysis) ලක් කරනු ලැබේ. දෙපාර්තමේන්තුව මඟින් වරින් වර නිකුත් කරන විශේෂ ගැසට් නිවේදනයවල දක්වා ඇති රෙගුලාසි වලට අනුකූලව පෙර ඇසුරුමේ ශුද්ධ මිනුම ඉඩදිය හැකි දෝෂය සමඟ පරීක්ෂා කර බලා අදාළ පෙර ඇසුරුම පිළිබඳ අවසන් තීරණය ගනු ලැබේ. පෙර ඇසුරුම් පිළිබඳ තොරතුරු 2007.05.29 දිනැති අංක 1499/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

## 2.3.5 නෛතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ලියාපදිංචිය

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 21 වැනි වගන්තියට අනුව කිරුම් පඩි, මිම්, කිරුම් හා මිනුම් උපකරණ විකිණීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, හෝ අලුත්වැඩියා කරනු ලබන ඕනෑම සංවිධානයක් හෝ පුද්ගලයෙකු හෝ ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. ඒ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘති පත්‍රයක් මඟින් ඉල්ලුම් කල යුතු අතර එයට නියමිත ගාස්තුවද ගෙවිය යුතුය. මෙවැනි ලියාපදිංචි කිරීමකදී ලබා දෙන සහතිකය එය නිකුත් කළ වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවලංගු වේ.

කිසියම් පුද්ගලයක් කිරුම් හෝ මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රථම තමන් ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් හා දක්ෂතා සම්පූර්ණ කර ඇති බව පෙන්වීම පිණිස දෙපාර්තමේන්තුව විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඒ සඳහා නියමිත විභාග ගාස්තු ගෙවිය යුතුය.

පඩි, මිම්, කිරුම් හෝ මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේදී අවශ්‍ය වන මෙවලම් හා උපකරණ අයදුම්කරු සතුව තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අදාළ අයදුම්කරුගේ වැඩපොළ/ කර්මාන්ත ශාලාව පරීක්ෂා කරනු ලැබේ.

එවැනි ස්ථාන පරීක්ෂාවකින්ද පසු සියලු පරීක්ෂණ පිළිබඳ අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන්නේනම් අදාළ පුද්ගලයා වෙත අලුත්වැඩියා කිරීමේ බලපත්‍රය නිකුත් කරනු ඇත. (වගු15,16) එම සහතිකය අන්සතු කළ නොහැක. ව්‍යාපාරයේ අයිතිකරු වෙනස් වුවහොත් සුදුසුකම් ලත් කාර්මික නිලධාරියෙකු සිටීම අනිවාර්ය වේ.

ලියාපදිංචි ගාස්තු ඇතුළු ලියාපදිංචි කිරීම් පිළිබඳ අනෙකුත් සියලුම තොරතුරු 2015.07.02 දිනැති අංක 1921/54 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත

වගුව 15 : නෛතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන
පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | එක් එක් ව්‍යවසාය කාණ්ඩ අනුව ලියාපදිංචි සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | නිෂ්පාදකයින් | ආනයනකරුවන් | විකුණන්නන් | අලුත්වැඩියාකරුවන් |
| කොළඹ | 05 | 27 | 38 | 53 |
| ගම්පහ | 05 | 06 | 25 | 32 |
| කළුතර | 03 | - | 17 | 22 |
| ගාල්ල | 01 | - | 12 | 12 |
| මාතර | 01 | - | 10 | 08 |
| හම්බන්තොට | - | - | 08 | 07 |
| මහනුවර | 1 | 03 | 15 | 22 |
| නුවරඑළිය | - | - | 10 | 03 |
| මාතලේ | 01 | 01 | 07 | 04 |
| බදුල්ල | - | 01 | 03 | 15 |
| කෑගල්ල | 01 | - | 03 | 08 |
| රත්නපුර | - | - | 16 | 06 |
| කුරුණෑගල | - | 01 | 21 | 16 |
| අනුරාධපුර | - | - | 07 | 08 |
| මොණරාගල | 01 | - | 08 | 03 |
| වව්නියාව | - | - | 05 | 02 |
| යාපනය | - | - | 02 | 03 |
| අම්පාර | - | - | 07 | 02 |
| මඩකලපුව | - | - | 04 | 02 |
| පොළොන්නරුව | - | - | 03 | 01 |
| පුත්තලම | - | - | 7 | 03 |
| ත්‍රිකුණාමලය | - | - | 03 | - |
| **එකතුව** | **19** | **39** | **231** | **232** |

වගුව 16 : නෛතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම - 2018 වර්ෂය

| **ලියාපදිංචි වර්ගය** | **2018 වසරේ ලියාපදිංචි වූ සංඛ්‍යාව** | **ලියාපදිංචි ගාස්තු රුපියල්** |
|---|---|---|
| කිරුම්/මිනුම් උපකරණ නිෂ්පාදකයින් | 19 | 44,000.00 |
| කිරුම්/මිනුම් උපකරණ අලුත්වැඩියාකරුවන් | 39 | 372,000.00 |
| කිරුම්/මිනුම් උපකරණ ආනයනය කර විකුණන්නන් | 231 | 138,600.00 |
| කිරුම්/මිනුම් උපකරණ විකුණන්නන් | 232 | 677,400.00 |
| **එකතුව** | **521** | **1,232,000.00** |

( ඉහත වගුවේ අදායම තුල මුද්දරවල මුහුණත වටිනකමද ඇතුලත් වේ )

# 3.

## MUSSD ජාත්‍යන්තර නියෝජිතයෙකු ලෙස

### 3.1 සාමාජිකත්ව

මිනුම් විද්‍යාවට අදාල අන්තර්ජාතික හා කලාපීය සහයෝගීතාව මිනුම් විද්‍යා සංස්ථාව පවත්වා ගැනීම සඳහා විවිධ රටවල් සමඟ මිනුම් විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්හි සම්බන්ධතා ඇතිකරගනු ලැබේ. මිනුම්වල ජාත්‍යන්තර අන්වේෂණතාව හැකියාව තහවුරු කිරීමට සහ වෙළඳාමේ දී ඇති වන තාක්ෂණික බාධක ජය ගැනීමට ද එය උපකාරී වේ. අප සතුව ඇති විද්‍යාත්මක හා වෙනත් මිනුම් පිළිවෙත් සඳහා ආරක්ෂිත පදනමක් සැපයීම සහ බොහෝ රටවල පැන නගින තාක්ෂණික ගැටළු අවම කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා තවදුරටත් අත්‍යවශ්‍ය වේ.

පඩි හා මිමි පිළිබඳ මහ සම්මේලනය හා මීටර් සම්මුතිය (General Conference of Weights and Measures)

පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය මීටර් සම්මුතිය (CGPM) යටතේ ආරම්භ කරන ලද අන්තර් රාජ්‍ය සංවිධානයකි.එය පඩි හා මිමි පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (CIPM) විධානය යටතේ ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශයේ (BIPM) විද්‍යාත්මක හා පරිපාලනමය වශයෙන් බැඳී පවතී.

පඩි හා මිමි පිළිබඳ මහ සම්මේලනය සාමාජික රජයයන්හි නියෝජිතයන්ගෙන්ද ආශ්‍රිත සාමාජිකයන්ගෙන්ද නිරීක්ෂකයන්ගෙන්ද සමන්විතය. පඩි හා මිමි පිළිබඳ මහ සම්මේලනය සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැරීසියේදී හමුවේ.එහි ප්‍රධාන කාර්යයක් වනුයේ ජාත්‍යන්තර ඒකක ක්‍රමයේ පැවැත්ම හා ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා අවශ්‍ය සාකච්ජා හා පරීක්ෂණ පැවැත්වීමය.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව මීටර් සම්මුතිය සඳහා අත්සන් කළ අතර 2007දී පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා ගත්තේය.

2018 වසරේදී මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවේ එක් සාමාජිකයෙක් ජාත්‍යන්තර සම්මත වේලාව පිලිබඳව ප්‍රංශයේ පැවති ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශයේ පුහුණුවකටද සහභාගී විය.

**CIPM අන්‍යෝන්‍ය පිළිගැනීම පිලිබඳ විධිවිධාන** (CIPM-MRA)

CIPM අන්‍යෝන්‍ය පිළිගැනීම පිලිබඳ විධිවිධාන යනු ජාතික මිනුම් විද්‍යා ආයතන විසින් පවත්වාගෙන යනු ලබන මිනුම් ප්‍රමිතීන්ගේ හා ඔවුන් විසින් නිකුත් කරනු ලබන ක්‍රමාංකන සහතික වල සමානතාවය ජාත්‍යන්තර වශයෙන් ප්‍රදර්ශනය කර ගැනීම සඳහා ඇතිකරගනු ලැබූ ගිවිසුමයි. මෙහි ප්‍රතිපලය වනුයේ ආයතනයන්හි අන්තර්ජාතිකව පිළිගනුලබන (අන්තර් ජාතික සමාලෝචකයන්ගේ අනුමැතිය ලැබූ ) ක්‍රමාංකන හා මිනුම් පිළිබඳ හැකියාවගේ අගයන්ය.( Calibration and Measurement Capabilities, CMC) අනුමත කරන ලද එම අගයන් හා තවත් තාක්ෂණික තොරතුරු (**BIPM**) වෙබ් අඩවියේ ඇති (CIPM - MRA) දත්ත සමුදයේ (මූලික සන්සන්දන දත්ත සමුදායේ, KCDB) ප්‍රසිද්ධ කර ඇත.

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව 2007දී CIPM - MRA ගිවිසුම අත්සන් කළ අතර ක්‍රමාංකන හා මිනුම් පිළිබඳ හැකියා අගයන් (CMC) ප්‍රසිද්ධ කිරීම සඳහා පියවර ගනිමින් සිටී.

## නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (OIML)

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය යනු වෙළඳ අවහිරතා හා ලෝක වෙළඳ පොළෙහි වියදම් අවම කිරීම අදිය සඳහා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් හා කර්මාන්ත මගින් අන්‍යොන්‍ය වශයෙන් පිළිගනු ලබන රෙගුලාසි ප්‍රමිති හා අනෙකුත් අදාල ලේඛන සැදීම සඳහා ඇතිකරනු ලැබූ අන්තර්රාජ්‍ය බැඳීමකි. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ සංවිධානය ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ ගිවිසුමහි තාක්ෂණික අවහිරතා පිළිබඳ "අන්තර් ජාතික ප්‍රමිති පිහිටුවන ආයතනය " ලෙස සැළකිය හැකිය. එමනිසා වෙළඳාම සහ වෙළඳ අවහිරතාව පිළිබඳ ගිවිසුම අත්සන් කර ඇති සියළු රටවල් විසින් OIML ප්‍රකාශ ඔවුන්ගේ තාක්ෂණික රෙගුලාසි සැදීමේදී සැළකිල්ලට ගත යුතුය.

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (CIML) යනු OIMLහි තීරණ ගන්නා මණ්ඩලය වේ. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව OIMLහි පූර්ණ සාමාජිකත්වය දරණ අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් ස්ථිර සම්බන්ධිත ආයතනයද වේ .

## ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන (APMP)

ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන යනු සාමාජික රටවල් අතර ප්‍රවීණතාව හා තාක්ෂණික සේවා හුවමාරු කරගනිමින් කලාපීය මිනුම් විද්‍යාත්මක හැකියාවන් වැඩිදියුණු කරගැනීම සඳහා ජාතික මිනුම් විද්‍යා ආයතන වලින් සැදුනු සංවිධානයකි.තවද APMP යනු මිනුම් ප්‍රමිති හා ක්‍රමාංකන සහ මිනුම් සහතික ලෝකය පුරා අන්‍යොන්‍ය වශයෙන් පිළිගැනීම ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාවලියේදී පඩි හා මිම් පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (CIPM) හි පිළිගත් ආසියා ශාන්තිකර කලාපීය මිනුම් විද්‍යා සංවිධානයි.

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව 1977 සිට ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනෙහි සාමාජිකත්වය දරයි. දෙපාර්තුමේන්තුව තාක්ෂණික කමිටු 9 ක් හා කේන්ද්‍රීය කණ්ඩායම් (focus group) 3කට ක්‍රියාකාරීව සහභාගි වේ.

2018 වසරේදී ද මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව APMP රැස්වීම් සඳහා ක්‍රියාකාරීව සහභාගි විය.

- MEDEA ව්‍යාපෘතියේ සහය ඇතිව චීනයේ හොන්ග් කොන්ග් හි පැවති APMP- 2018 වසර මැද රැස්වීමට සහභාගි විය.
- සිංගප්පූරුවේ පැවති APMP මහ මණ්ඩලයට සහභාගි විය.
- සිංගප්පූරුවේ පැවති APMP තාක්ෂණික කමිටු රැස්වීම් 6 කට පහත පරිදි සහභාගි විය.

  - තාක්ෂණික කමිටු රැස්වීම් - උෂ්ණත්වය (TCT)
  - තාක්ෂණික කමිටු රැස්වීම් - ස්කන්ධය සම්බන්ධිත රාශින් (TCM)
  - තාක්ෂණික කමිටු රැස්වීම් - කාලය හා සංඛ්‍යාතය (TCTF)
  - තාක්ෂණික කමිටු රැස්වීම් - ද්‍රව්‍ය ප්‍රමාණය (රසායන විද්‍යාව හා ජීව විද්‍යාව සහ මිනුම් විද්‍යාව) (TCQM)
  - තාක්ෂණික කමිටු රැස්වීම් - විද්‍යුතය හා චුම්භකත්වය (TCEM)
  - තාක්ෂණික කමිටු රැස්වීම් - ප්‍රකාශමිතිය හා විකිරණමිතිය (TCPR)

## 3.2 ව්‍යාපෘතිවල ප්‍රතිලාභ

**PTB- ශ්‍රී ලංකා ද්වි පාර්ශ්වික ව්‍යාපෘතිය**
**ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීම**

PTB යනු ජර්මනියේ ජාතික මිනුම් ආයතනය (NMI) වේ. එය යුරෝපීය රටවල අවශ්‍යතාවන්ට සරිලන පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවලට සහාය වේ. PTB-ශ්‍රී ලංකා ද්වි පාර්ශ්වික ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ උතුරු කලාපයේ පිහිටා ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (SME) විසින් ජාත්‍යන්තර යහපත් පිළිවෙත් මත පදනම්ව ගුණාත්මකභාවය සහතික කිරීමේ සේවාවන් වැඩිදියුණු කාරවීමයි. මෙම ව්‍යාපෘතියට ජාතික තත්ත්ව යටිතල ව්‍යුහයේ ප්‍රධාන ආයතන (MUSSD, ITI, SLSI සහ SLAB) මෙන්ම කලාපීය රසායනාගාර, දේශීය මූලස්ථාන සහ උතුරේ සංවිධාන ඇතුළු බහු පාර්ශ්වකරුවන්ද ඇතුලත්ය.

2018 දී PTB-ශ්‍රී ලංකා ද්වි පාර්ශ්වික ව්‍යාපෘතියේ සහාය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ජාතික මිනුම් විද්‍යාගාරයෙ හි සිදු කරනු ලබන පීඩනය,උෂ්ණත්වය ,ස්කන්ධය මිනුම් සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීම සඳහා උපදේශනය සැපයීම
- ප්‍රවීණතා පරීක්ෂණ (Proficiency testing) පිළිබඳ පුහුණුවට සහභාගී වීමට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවෙ හි කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට සහාය වීම
- මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවෙන් සම්පත්දායකත්වය සැපයීම - වවුනියා කැම්පස්
- ලෝක මිනුම් විද්‍යා දිනය 2018 සඳහා අනුග්‍රහය දැක්වීම.

**සාර්ක් -PTB ව්‍යාපෘතිය**
**දකුණු ආසියාවේ ගුණාත්මක යටිතල පහසුකම්, ක්ෂේත්‍රයේ කලාපීය ඒකාබද්ධතාවය සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම**

සාර්ක් සාමාජික රටවල් අතර විශේෂඥ දැනුම හා තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම මගින් ගුණාත්මක යටිතල පහසුකම්වල ධාරිතා සංවර්ධනය කෙරෙහි මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කරයි. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යාගාරය ලෙස සාර්ක්-PTB ව්‍යාපෘතියේ (එනම් පුහුණු වැඩසටහන්, වැඩමුළු) ප්‍රතිලාභියෙකි. තවද, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව ජාතික මිනුම් පර්යෙෂනාගාරයේ (NML) මිනුම් හැකියාව ප්‍රදර්ශනය කිරීම සඳහා සාර්ක්-PTB ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද අන්තර් සංසන්දනය සඳහා මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව සහභාගී වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා PTB හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMI) අරමුදල් සපයයි.

2018 දී නේපාලයේ කත්මන්ඩු නුවර පැවති සාර්ක්-PTB ව්‍යාපෘති අදියර 2 හි ආරම්භක වැඩමුළුවට MUSSD හි අධ්‍යක්ෂවරයා සහභාගී විය.

## UNIDO ව්‍යාපෘතිය

අනුකූලතාව සහ ගුණාත්මක යටිතල පහසුකම් සේවා ශක්තිමත් කිරීම සඳහා UNIDO ආයතනය ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) ආයතන සමඟ සමීපව කටයුතු කරයි. විශේෂ අවධානය යොමු කළ අංශ වන්නේ කුළුබඩු සහ සැකසූ ආහාර වැනි අපනයන අරමුණු කරගත් අංශයයි. මෙම ක්‍රියාකාරකම් යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන යුරෝපීය සංගමයේ (EU) ශ්‍රී ලංකාවේ වෙළඳ ආශ්‍රිත ආධාර ව්‍යාපෘතියක රාමුව තුළ සිදු වේ.

යුනිඩෝ ව්‍යාපෘතියේ සහාය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- ISO 17025: 2017 පිළිබඳ පුහුණුවට සහභාගී වීමට MUSSD හි කාර්ය මණ්ඩල සාමාජිකයින් 8 දෙනෙකුට අවස්ථාව සැලසීම.
- MUSSD විසින් සංවිධානය කරන ලද 2018 ලෝක මිනුම් විද්‍යා දිනයේ සම්මන්ත්‍රණයට සහාය වීම
- 2018 ලෝක මිනුම් විද්‍යා දින සැමරුමේ උත්සවයක් ලෙස පාසල් ළමුන් සඳහා පැවැත්වූ රචනා හා චිත්‍ර තරඟ සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම .

## MEDEA-PTB ව්‍යාපෘතිය

ආසියාවේ කලාපීය මිනුම් විද්‍යා විශේෂඥයන් ජාලයන්හි - ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන (APMP) සහ ආසියා- ශාන්තිකර නෛතික මිනුම් විද්‍යා සංසදය (APLMF) - සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගේ මිනුම් විද්‍යාත්මක පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රාහකත්වය ලබා දීමේ හැකියාව ප්‍රවර්ධනය මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය ජාතික මිනුම් විද්‍යා ආයතනය(NML) හා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් (LMA) සඳහා විශේෂ දායකත්වයක් සපයයි.මෙම ව්‍යාපෘතිය සඳහා PTB හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMS) අරමුදල් සපයයි.

MEDEA ව්‍යාපෘතියේ සහාය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

- දකුණු කොරියාවේ KRISS හි Global Metrology Academy(GMA) මගින් පවත්වනු ලැබූ ප්‍රකාශ මිතිය හා විකිරණ මිතිය සඳහා මිනුම් විද්‍යාව පිළිබඳ වැඩමුළුවට සහභාගී වීම.
- චීනයේ පැවති පෙර ඇසුරුම් කළ භාණ්ඩ පිළිබඳ OIML / APMLF පුහුණු පාඨමාලාවට සහභාගී වීම.
- තායිලන්තයේ ජාතික මිනුම් විද්‍යා ආයතනයේ (NIMT) පැවති හයිඩ්‍රොලික් පීඩන ප්‍රමිතිය පිළිබඳ අවසන් අන්තර්සන්සන්දන වැඩමුළුවට සහභාගී වීම.
- මැලේසියාවේ පැවති බර, පාලම් ඇතුළු ස්වයංක්‍රීය නොවන බර කිරිමේ උපකරණ සත්‍යායනය පිළිබඳ පුහුණු පාඨමාලාවට සහභාගී වීම.
- චීනයේ හොංකොං හි පැවැත්වෙන APMP වසර මැද රැස්වීම සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වලට සහභාගී වීම.
- තායිලන්තයේ පැවති CABUREK වැඩසටහනට සහභාගී වීම.
- තායිලන්තයේ පැවති සහල්වල තෙතමනය මැනීමේ උපකරණය සත්‍යාපනය කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාවට සහභාගී වීම.

### 3.3 විදේශීය ජාතික මිනුම් ආයතන සමඟ සහයෝගීතාවය

ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ආයතනය ලෙස මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව කලාපීය මෙන්ම ජාත්‍යන්තර මට්ටමින් අනෙකුත් විදේශීය ජාතික මිනුම් විද්‍යා ආයතන හා සම්බන්ධතාවය පවත්වාගෙන යයි .

KRISS Korea Research Institute of Standards and Science

**කොරියාවේ ප්‍රමිති හා විද්‍යා ආයතනය (KRISS)**

දකුණු කොරියාවේ ප්‍රමිති හා විද්‍යා ආයතනය (KRISS) විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ (UST) සහයෝගයෙන් මිනුම් විද්‍යා පශ්චාත් උපාධි පාසලක් පවත්වාගෙන යයි. මෙම පාසල විසින් ස්ථානීය අධ්‍යාපනය තුළින් ඉහළ සුදුසුකම් ලත් පර්යේෂණ හා සංවර්ධන වෘත්තිකයින් පෝෂණය කිරීම සඳහා මිනුම් විද්‍යාව හා තාක්‍ෂණය පිළිබඳ විද්‍යාපති හා ආචාර්ය උපාධි පාඨමාලා පවත්වයි. KRISS හි පහසුකම් සහ ශ්‍රම බලකාය උපයෝගී කරගනිමින් ඉලක්ක ගත පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ.

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු 2018 දී UST හි මිනුම් විද්‍යාව පිළිබඳ පළමු ආචාර්ය උපාධිය KRISS ආයතනයෙන් ලබා ගෙන ඇත. එය දකුණු කොරියාවේ UST වෙතින් පූර්ණ ශිෂ්‍යත්වයක් යටතේ ලබා ගන්නා ලදී.

# 4.

# MUSSD තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ආධාරකරුවෙකු ලෙස

## 4.1 තිරසාර සංවර්ධන ඉලක්ක සහ මිනුම් විද්‍යාව

ශ්‍රී ලංකාව ඇතුළු සියලුම එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් සම්මත කරන ලද 2030 තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය, ජනතාවට සහ ලෝකයට සාමය සහ සමෘද්ධිය සඳහා හවුල් සැලැස්මක් සපයයි. එහි හවුල්කාරිත්වය වන්නේ තිරසාර සංවර්ධන ඉලක්ක 17 (SDGs) වන අතර එය ගෝලීය හවුල්කාරිත්වයකින් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින සියලුම රටවල් විසින් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු කැඳවීමකි.

මිනුම් විද්‍යාව යනු ගුණාත්මක යටිතල පහසුකම් පද්ධතියේ මූලික කුළුණක් වන අතර බොහෝ SDG සඳහා අත්‍යවශ්‍ය වේ. වෙළඳාම, විද්‍යාත්මක සංසන්දනය, නවෝත්පාදන සහ නැගී එන තාක්ෂණයන් සඳහා එය අත්‍යවශ්‍ය වේ. ලෝකයේ සීඝ්‍ර වෙනසක් සමඟ, වැඩිදියුණු කළ මිනුම් ප්‍රමිතීන් සඳහා සහ නියාමන ක්‍රියාකාරකම්, සෞඛ්‍ය, මහජන ආරක්ෂාව සහ පරිසර සුරක්ෂිතතාව සහ නිෂ්පාදනය පරීක්ෂා කිරීමේ ගුණාත්මකභාවය පිළිබඳ මිනුම් විද්‍යාත්මක සංකල්ප අනුගමනය කිරීම අඛණ්ඩව වැඩි වීමක් දක්නට ලැබේ.

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුව විසින් **"තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය"** සඳහා ක්‍රියාකාරී දායකත්වයක් සපයන **SDGs 04** ක් හඳුනාගෙන ඇත.

### අරමුණු 01 - දුප්පත්කම දුරලීම

මිනුම් ක්‍රමයක් හරහා මිනුම් නියාමනය කිරීම බොහෝ මිනුම් ක්ෂේත්‍රවල සැමට සමාන බවක් අරමුණු කරයි.

- කුඩාම වෙළඳපොළවල පවා වෙළඳ සුරක්ෂිතතාවයක් ඇති කිරීම සියළුම ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා නිවැරදි ගෙවීමක් ලබා දෙන බවට සහතික වනු ඇත.
- පෙර ඇසුරුම් කළ භාණ්ඩ පාලනය කිරීම තුලින් වැඩියෙන් වැදගත් ආහාර ද්‍රව්‍ය ගැන සැලකිලිමත් වන අතර ක්ෂේත්‍රයේ වංචා අවම කිරීමට උපකාරී වේ.
- නිවැරදි මිනුම මඟින් ගෙවන ලද මිල පමණක් නොව, අපනයන සඳහා නිවැරදි බදු එකතු කිරීමට රජයන්ට හැකි බව සහතික කරනු ඇත.

මාර්ග ආරක්ෂාවට අදාළ වන වාහන වේගය මැනීම සහ රුධිරගත ඇල්කොහොල් ප්‍රමාණය මැනීම සඳහා නීතිමය මිනුම් පාලනයන් යෙදීම තුලින් අනතුරු අනුපාතය අඩු කළ හැකිය. සිදුවන ජීවිත හානි වලට අමතරව සෑම කෙනෙකුගේම ප්‍රයෝජනය සඳහා භාවිතා කළ හැකි ජාතික සම්පත් සැලකිය යුතු ලෙස අඩුවීමද අනතුරු නිසා සිදුවේ. එම නිසා, නිවරදි මිනුම් භාවිතයෙන් ජාතික සම්පත් ආරක්ෂා කර ගත හැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙස දුප්පතුන්ගේ ජීවන වියදම පහත දැමිය හැකි අතර ඔවුන්ගේ දෛනික ආදායම වැඩි කළ හැකිය.

සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ, රෝගියාගේ බර, උෂ්ණත්වය සහ රුධිර පීඩනය වැනි වඩාත් මූලික පරාමිතීන් පවා නිවැරදිව මැනීම තුලින් වඩාත් නිවැරදි රෝග විනිශ්චයක් ලබා දීමට සහ සෞඛ්‍ය වැඩිදියුණු කිරීමට හේතු වේ.

### අරමුණු 03 - යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම

වෛද්‍ය මිනුම්, සෞඛ්‍යාරක්ෂාවේ අංගයක් වන අතර රෝග වැළැක්වීම, රෝග විනිශ්චය කිරීම, ප්‍රතිකාර කිරීම සහ වෙනත් වෛද්‍ය තත්වයන් සඳහා මූලික වේ.ජාත්‍යන්තරව හඳුනාගත් හා පිළිගත් වෛද්‍ය විද්‍යාගාරවල මිනුම් හා මිනුම් ප්‍රමිති සඳහා අන්වේෂනතාව (Traceability) පහත කරුණු සඳහා මඟ පාදයි.

- සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම,
- “ව්‍යාජ ධනාත්මක” සහ “ව්‍යාජ සෘණාත්මක” පරීක්ෂණ ප්‍රතිඵල අවම කිරීම
- රජයන් සහ සෞඛ්‍ය රක්‍ෂණකරුවන් සඳහා වන පිරිවැය අඩු කිරීම සහ සෞඛ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
- ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හේතුවෙන් පුනරාවර්තන පරීක්ෂණ සංඛ්‍යාව අඩු කිරීම
- ගුණාත්මක බවින් යුත් රෝග විනිශ්චය සඳහා වන පිරිවැය අඩු කිරීම.
- කලාපීය ප්‍රමිතීන් ඒකාබද්ධ කිරීමෙන් අතිරික්ත ප්‍රමිතීන් ඉවත් කිරීම.
- වෙළඳාම සඳහා තාක්ෂණික බාධක ඉවත් කරන මිනුම් සහ පරීක්ෂණ ගෝලීයව පිළිගැනීම

### අරමුණු 07 - දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

නූතන සමාජීය ජීවනාලිය ලෙස කර්මාන්ත, ප්‍රවාහන, නිවාස උණුසුම් කිරීම හා ආලෝකකරණය හා ඩිජිටල් සන්නිවේදනය සඳහා අපි බලශක්ති යොදා ගන්නෙමු.

බලශක්ති භාවිතය වැඩි වීම හා කාබන් මත පදනම් වූ ඉන්ධනවල භාවිතය වැඩිවීම පරිසරයේ $CO_2$ ප්‍රමාණය වැඩිවීමට විශාල බලපෑමක් කරයි. පරිසරයට නිකුත්වන $CO_2$ හා අනෙකුත් නුසුදුසු විමෝචන පාලනය කිරීම සඳහා මිනුම් හා මිනුම් විද්‍යාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

## අරමුණු 09 - කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම්

ඉහළ කාර්යසාධනයක් සහිත නිෂ්පාදන සහ නිෂ්පාදන පද්ධතිවල පවතින පුළුල් පරාසයක පරාමිතීන් සහ නිෂ්පාදන පරිසරයන් සඳහා නිවැරදි මිනුම් අවශ්‍ය වේ. බොහෝ සංවර්ධනය වෙමින් පවතින හා කාර්මික සංවර්ධිත රටවල් ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය පාලනය කරන අතර ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කරයි. ඒ සඳහා සමාගම් නිරන්තරයෙන්ම සැලකිලිමත් වන්නේ ඔවුන්ගේ උපකරණ ආශ්‍රයේ ප්‍රමිති අනුව සැකසීම හා මිනුම් අන්වේෂනතාව තහවුරු කර ගැනීම සඳහාය. ගෝලීය වෙළඳපල තුළ ඵලදායී මිනුම් හා ක්‍රමාංකන යටිතල පහසුකම් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා එකතු කළ අගයක් ලබාදෙන  අතර ඔවුන්ගේ කේවල් කිරීමේ ශක්තියට බලපෑම් කරයි.

මිනුම් යටිතල පහසුකම් සහතික කිරීම සඳහා ඵලදායී ක්‍රමාංකනය සහ පරීක්ෂණ සෘජුවම සිදු කරයි.

- සංරචක සහ නිමි භාණ්ඩ නියාමන අවශ්‍යතා, ලේඛන ප්‍රමිතීන් සහ පිරිවිතරයන් සපුරාලයි
- නිෂ්පාදන වටිනාකම / මිල සහ විශ්වසනීයත්වය ඇතුළුව පාරිභෝගික හා කාර්මික ගුණාත්මක අපේක්ෂාවන් සපුරාලයි.
- CIMP MRA භාවිතය සහ වාණිජ රසායනාගාර ප්‍රතීතනය මිනුම් සහ පරීක්ෂණ ප්‍රතිඵල ජාත්‍යන්තරව පිළිගැනීම මඟින් නැවත නැවත පරීක්ෂා කිරීමෙන් තොරව වෙළඳ බාධක වළක්වා ගත හැකිය.

# 5. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තුමේන්තුවෙහි ශක්තිය (මානව සම්පත් කළමනාකරණය)

## 5.1 කාර්ය මණ්ඩල සංයුතිය

වගුව 17 : කාර්ය මණ්ඩල සංයුතිය – 2018

| තනතුර | වැටුප් කාණ්ඩය | සේවා ගණය | පන්තිය | අනුමත තනතුරු සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | | | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | අනියම් | වැඩ බලන | |
| මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ | SL-1-2016 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | I | 01 | - | - | | |
| මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | SL-1-2016 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | III/II/I | 15 | 9 | - | - | 06 |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | SL-1-2016 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | III | 01 | - | - | 01 | 01 |
| ගණකාධිකාරී | SL-1-2016 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | II/I , II/II | 01 | 01 | - | - | - |
| ගණකාධිකාරී(අභ්‍යාන්තර විගණන) | SL-1-2016 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | II/I , II/II | 01 | - | - | - | 01 |
| පරිපාලන නිලධාරී | MN-7-2016 | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | විශේෂ | 01 | - | - | 01 | 01 |
